# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2019 (නව නිර්දේශය)

# 71 - සිංහල I

## <u>ලකුණු බෙදීයාම</u>

## <u>I පත්‍රය</u>

මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් සමන්විත ය. පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය.

පළමු ප්‍රශ්නය :- මෙම ප්‍රශ්නය (අ), (ආ), (ඉ), (ඊ), (උ), (ඌ),(ඒ) යනුවෙන් කොටස් හයකින් සමන්විත ය.

* (අ), (ආ), (ඉ), (ඊ), (උ) අවබෝධය - ලකුණු 16 (4 x 4 = 16)
  (මෙම කොටස් පහෙන් හතරකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය.)

* (ඌ) අවස්ථා සම්බන්ධය - ලකුණු 12 (3 x 4 = 12)
  (I, II, III, IV,V, VI, VII මෙම කොටස්වලින් අවස්ථා හතරකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය.)

* (එ) රසාස්වාදය - ලකුණු 12

ලකුණු 40

අංක 02 සිට 08 දක්වා ප්‍රශ්න නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරෙන් සකසා ඇත. ඒ අතුරින් 04කට පිළිතුරු සැපයිය යුතු වේ. එක් ප්‍රශ්නයකට 15 බැගින් ලකුණු 60කි. (4 වන ප්‍රශ්නය (අ), (ආ) යනුවෙන් කොටස් දෙකකි. (අ) කොටසට ලකුණු 07කි. (ආ) කොටසට ලකුණු 08කි.)

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමග □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ..................................................... ..................................................... ..................................................... √ △ $\frac{4}{5}$

(ii) ..................................................... ..................................................... ..................................................... √ △ $\frac{3}{5}$

(iii) ..................................................... ..................................................... ..................................................... √ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.

2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

***

# අභිමතාර්ථ

## I පත්‍රය

අ.පො.ස. (උ.පෙළ) විභාගයට පෙනී සිටින විද්‍යාර්ථීන් සතු ව පවතින,

- සම්භාව්‍ය සිංහල (නිර්දිෂ්ට) ගද්‍ය හා පද්‍ය කෘති කියවා අවබෝධ කර ගැනීමේ ශක්‍යතාව හඳුනා ගැනීම ද
- නූතන ගද්‍ය-පද්‍ය හා කාව්‍ය නිර්මාණ රස විඳීම හා තදනුබද්ධ විචාරාත්මක දෘෂ්ටිය කෙබඳු, දැයි හඳුනා ගැනීම ද
- කාව්‍ය විචාර සංකල්ප හඳුනාගෙන රස විඳීම හා විචාරය කිරීමේ ශක්‍යතාව මැන බැලීම ද මෙම පත්‍රයෙන් අපේක්ෂිත ය.

**1.** පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) සහ (උ) උද්ධෘත අතුරෙන් **හතරක්** තෝරාගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට ද (ඌ) සහ (එ) ප්‍රශ්නවලට ද පිළිතුරු සපයන්න. (මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.)

**(අ)** බුදුහු එදවස් අලුයම් වේලෙහි මහකුලුණු සමවතට සමවැද එයින් නැඟී පෙර බුදු වූ බුදුවරුන්වහන්සේ සමයෙහි මහත් සේ කොට පුරාපී පින්කම් ඇති හේතුසම්පන්න පුද්ගලයන් දක්නා පිණිස බුදුඇසින් ලොව බලනසේක් දසදහසක් සක්වළ නැමැති මහමුහුද වසා නුවණදැල දැමූසේක. මට්ටකුණ්ඩලී නැමැති කුඩමසු පිළ නැමැති **දියකොල්බඩ** හොත්තේ බුදුන්ගේ නුවණදැලට තමා සම්භ වුවමනා හෙයින් වැදහොත් ලෙසින් ම නොසෙල්වී නොපෙරළී නුවණදැල බැඳිණ. බුදුහු ඔහු දැක මා එතනට යාමෙන් වන ප්‍රයෝජන කවරේ දෝහෝ යි පරීක්ෂා කරනසේක් 'මා එතනට ගිය කල මට්ටකුණ්ඩලියා මා කෙරෙහි සිත පහදවාගෙන කොටගත් අනික් පින්කමක් නැතත් සිත පහදවාගත් පමණකින් මියගොසින් තවුතිසා දෙව්ලොව එක්සිය විසිගවුවක් විතර උස ඇති රන්විමනෙක උපදිී. ඔහු පිරිවරා දෙවඟනෝ දහසක් දෙන පහළ වෙති.'

(i) බුදුරදුන් මහකුලුණු සමවතට සමවැද එයින් නැඟී ලොව බැලූයේ කුමක් නිසා ද?

(ii) බුදුරදුන්ගේ නුවණ දැලට හසු වූයේ කවරකු ද?

(iii) "වැදහොත් ලෙසින් ම නොසෙල්වී නොපෙරළී නුවණදැල බැඳිණ" මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv) **'දියකොල්බඩ'** යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

(i) පෙර බුදුවරුන් වැඩ විසූ කාලයෙහි කළ පින්කම් ඇති හේතු සම්පන්න පුද්ගලයන් දකිනු පිණිස

(ii) මට්ටකුණ්ඩලී

(iii) වැතිර සිටි ආකාරයෙන් ම සෙලවීමක් නැති ව, පෙරළීමක්, නැති ව ඥානය නමැති දැලෙහි බැඳුණේ ය / නුවණ නැමැති දැලෙහි බැඳුණේ ය.

(iv) දියකොල්බඩ

දිය යනු ජලය යි. කොල් යනු කෙළවර යන්න යි. බඩ යන්නෙන් ආසන්න බව හැඟවෙයි. ඒ අනුව ජලාශයක ජලය රඳන කෙළවර, සීමාව, අසල යන්න මෙයින් ගම්‍ය වෙයි. ඒ අනුව 'දියකොල්බඩ' යනු දිය පාර අසල, ඉවුර අසල, වෙරළ අසල යන අදහස දෙයි.

(ආ) තව ද මේ අනුරුද්ධකුමාරයෝය, භද්දියකුමාරයෝය, කිම්බිලකුමාරයෝය යන මේ රජකුමරුවෝ තුන්දෙන පසළොස්, සොළොස් හැවිරිදි අවස්ථාවෙහි ඔවුනොවුන් හා සමග කෙළකෙළ හිඳ "බත් උපදනේ කොයින් දැ"යි සැක කළහ. එයින් කිම්බිලකුමාරයෝ එක් දවසෙක කෙළගෙන යන්නාහු **බඩසලින්** වී බානා දැක ඒ සලකුණෙන් "බත් උපදිනේ බඩසලිනැ"යි කීහ. භද්දියකුමාරයෝ දවසෙක සැළියෙන් බත් රන්තලියේ ලන්නා දැක ඒ සලකුණෙන් "බත් උපදිනේ බඩසලින් නොවෙයි; සැළියෙනැ"යි කීහ. අනුරුද්ධකුමාරයෝ කොටුවෙන් වී බානාත් නුදුටුවිරූහ. සැළියෙන් බත් ගන්නාත් නුදුටුවිරූහ. ඉදිරියෙහි කන්නට තබාලූ බත් ම දුටුවිරූහ. එසේ හෙයින් "තොප දෙන්නා ම කියන්නේ නොදැනය; බත් උපදිනා තැන් මම දනිමි; වඩු රියන් උස කැකුළු ඇති මහරන්තලියකින් බත් උපදින්නේය"යි කීහ.

(i) කුමාරවරුන් සැක කළේ කුමක් ගැන ද?
(ii) කිම්බිල කුමාරයා කී පරිදි බත් උපදින්නේ කොතනින් ද?
(iii) "කොටුවෙන් වී බානාත් නුදුටුවිරූහ" මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.
(iv) '**බඩසල**' යන යෙදුමට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

(i) බත් උපදින්නේ කොතනින් ද යන්න ගැන ය.

(ii) බඩසලින්/භාණ්ඩාගාරයෙන්/භාණ්ඩ ශාලාවෙන්/කොටු ගුලින්/ගබඩාවෙන්

(iii) කොටුවෙන් වී පිටතට ගන්නා ආකාරය කලින් දැක නැත/පෙර දැක නැත/දැක පුරුදු නැත.

(iv) බඩසල

බඩ යන්නෙන් භාණ්ඩ ද සල යන්නෙන් ශාලාව ද අර්ථවත් වේ. අතීත ව්‍යවහාරයේ 'බඩසල' යන්න නූතන ව්‍යවහාරයේ භාණ්ඩාගාරය ලෙස ගත හැකි ය. පැරණි වහරේ ධාන්‍ය හා වස්තුව තැන්පත් කර තිබූ ස්ථානවලට 'බඩසල' යන්න භාවිත කොට ඇත. 'කොටුගුල' යනුවෙන් ද මෙය යෙදී ඇත.

**(ලකුණු 04 යි)**

(ඉ) **පංචසිඛය**, තොපි උකුසු වේසයෙන් ආකාශයෙන් ඇවිදුව, මාතලිය, තොපි මත්ස්‍ය වේසයෙන් මා යන ඉදිරියට දියෙන් ගොඩ පැන පියව, මම කට තුබූ මාංශය දමා මත්ස්‍යයා ඩැ ගන්ට යෙමි. පංචසිඛය "තෝ උකුසු වේසයෙන් මා දැමූ මාංශ කැටිය ඩැ ගනුව, මාතලිය තෝ මත්ස්‍ය වේසයෙන් දියට පැන පියව"යි කියා තුන් දෙන අවුත් ඒ ස්ත්‍රිය සමීපයෙහි පෙනී ගියාහ.
කැණහිල් මාංශ කැටියක් ඩැ ගෙන ගඟ සමීපයේ ගොඩ අසල යන කලට මත්ස්‍යයෙක් දියෙන් ගොඩට පැන පීය. කට තුබූ මාංශ දමා මත්ස්‍යයා ඩැ ගන්ට දිවූ කල මත්ස්‍යයා දියට පැන පීය. උකුසු මාංශ කැටිය ඩැ ගත, එකියන සිගාලයා මත්ස්‍යයාත් නො ලැබ මාංශ කැටියත් නො ලැබ වික්ෂේප ව ගඟ සමීපයේ උන් ස්ත්‍රියගේ මූණ බල බලා සිටියේ ය. එවිට එකියන ස්ත්‍රී මහත් කොට සිනා සී පුවාහ.

(i) මාතලී මවාගත් වේශය කුමක් ද?
(ii) සිගාලයා වික්ෂේපයට පත් වූයේ ඇයි?
(iii) "මම කට තුබූ මාංශය දමා මත්ස්‍යයා ඩැ ගන්ට යෙමි." මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.
(iv) '**පංචසිඛ**' යන වචනයට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි.)

(i) මාළුවකුගේ ස්වරූපය / මාළුවකුගේ වේශය

(ii) මාළුවාත් මස්කැටියත් / මස් කුට්ටියත් / මස් කෑල්ලත් නොලැබීමෙනි / නොලැබීයාම නිසා ය.

(iii) මම කටේ තිබුණු මස් කැබැල්ල ඉවත දමා /අතහැර / මාළුවා අල්ලා ගැනීමට / ඩැහැ ගැනීමට යමි.

(iv) පංචසිඛ
ශක්‍රයාගේ වීණා වාදකයා හෙවත් දිව්‍ය ගන්ධර්වයා ය.
හිස මුදුනේ කොණ්ඩා පහක් බඳින හෙයින් 'පංචසිඛ / පන්සිළු' යනුවෙන් හැඳින්වේ.

**(ලකුණු 04 යි)**

(ඊ) එකල වෙළෙඳාණන්ගේ භාර්‍යාවෝ තුන්වන වාරයෙහි ආ කෙල්ල දැක "එම්බා නැඟණියෙනි, මේ අනුන් සන්තක වස්තුවෙහි වරදවා පිළිපදනේය යි තොපගේ අමාත්‍යයාණන්ටත් නුගුණ ය; මෝතොමෝ තමාගේ ගෙහිමියා ඉක්ම පවත්නීය යි මටත් නින්දා වන්නේ ය; මෙසේ වරදවා පිළිපැද්දාවුන් අපායෙනුත් නොමිදෙන්නාහු මය"යි කියා මේ ලෝකයෙහි ස්ත්‍රී පුරුෂ යම් කෙනෙක් අනුන් සන්තක භාණ්ඩයෙහි වරදවා පවතිද් ද හෙවත් පුරුෂයෝ පරස්ත්‍රීසේවනය කෙරෙද් ද ස්ත්‍රීජාතිහු පරපුරුෂයන් සේවනය කෙරෙද් ද එසේ අපරාධ කළ ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයට ම නින්දාත් පැමිණෙයි. දඬුවම් ආදියත් වන්නේය. මෙසේ මෙලොව නොයෙක් **බැසනත්** විඳ පරලොව නරකයෙහි ඉපද සියක් යොදුන් උස ඇති සොළොසාඟුල් දිග කටු ඇති කොළඉඹුල් වෙනෙහි ඉවසිය නොහැකි දුක් විඳිති.

(i) වෙළෙන්දාගේ භාර්යාව කෙල්ල අමතා කළ ප්‍රකාශයෙන් දෝෂ දර්ශනයට ලක් වන්නෝ කවරහු ද?

(ii) අනුන් සන්තක දෙයෙහි වරදවා පැවතීමෙන් මෙලොව දී ලැබෙන විපාක දෙක දක්වන්න.

(iii) "සියක් යොදුන් උස ඇති සොළොසාඟුල් දිග කටු ඇති කොළඉඹුල් වෙනෙහි" මේ උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv) **බැසනත්** යන යෙදුමට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

(i) අමාත්‍යවරයා / ඇමතිවරයා හා නන්දිය වෙළෙන්දාගේ භාර්යාව

(ii) නින්දාවට ලක්වීම හා දඬ ගැසීම්වලට ලක්වීම / කළ වැරද්දට මුදල් ගෙවීම

(iii) යොදුන් සියයක් උස ඇති, අඟල් 16ක් දිග කටු ඇති කටු ඉඹුල් /කොළ ඉඹුල් වනයෙහි

(iv) බැසනත්

ව්‍යසන යන ව්‍යවහාරය වැසනත්, බැසනත් ලෙස ද භාවිතයට පැමිණ ඇත. පැරණි භාෂාවෙහි 'ව' වෙනුවට 'බ' ආදේශ වී තිබේ.

**ඡේදයේ ඇතුළත් වචන වෙනුවට ව්‍යවහාරයේ පවතින සමීපාර්ථවත් වෙනත් වචන ලියා ඇත්නම් ලකුණු ප්‍රදානය කරන්න.**

(උ) නැත රිවි රැස් පහ ස
නොපිපෙන තඹුරු වන ලෙ ස
ඔහු වෙණ නදින් මි ස
අනික් නදකින් අපි නොවෙමු තො ස

ගොදුරු ලොබ දුරු ක ර
ඔහු නිවෙස වට තුරුසි ර
නොපැහැර **පියපත** **ර**
සියොත්හුද ඉඳ අසති වෙණස ර

(i) රිවි රැස් නැති විට නො පිපෙන්නේ කුමක් ද?

(ii) ගොදුරු ලොබ දුරු කළ පක්ෂීන් තුරුසිරට වී වීණා නාදය අසා සිටියේ කෙසේ ද?

(iii) "ඔහු වෙණ නදින් මි ස
අනික් නදකින් අපි නොවෙමු තො ස"
මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv) **පියපතර** යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

(i) නෙළුම් වනය / තඹුරු වනය / නෙළුම් විල

(ii) පියාපත් නො ගසා / පියාපත් නො විදහා / පියාසර කිරීම නවත්වා

(iii) ඔහුගේ වීණා නාදයෙන් මිස අනෙක් නාදයකින් අපි සතුටු නො වෙමු.

(iv) පියපතර

පියපතර යන්න පක්‍ෂපත්‍ර යන්නෙන් බිඳී එයි. පිහාටු, පියාපත් යන ලෙස ද යෙදේ.

- (ඌ) සහ (ඒ) ප්‍රශ්න **දෙකට ම** පිළිතුරු සපයන්න.

(ඌ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් **හතරක** අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i) “මම වන්නා දරුශෝකයෙන් හඬමි. තෙපි කුමක් නිසා හඬා දැ'යි”

(ii) “මොහු නුවරින් පිටත ගෙන ගොස් උක්කාරභූමියෙහි ලා පියව”

(iii) “මාගේ ස්වාමි පුත්‍රයාට පැමිණි මරණ දුක්ඛය තට ද වේව යි”

(iv) “කැනහිල් ධේනුවක් තොමෝ උතුම් වූ සිංහරාජයකු හා එක් ව කෙසේ නම් සමාගම් වේ දැ'යි”

(v) “ඒත් උඹේ පැටියන්ගෙන් බැද්ද ම සූරිකනවා”

(vi) “සතුරන් සහසක් කළ ද පරාජය - තමහට තම සිත වේ පසමිතුරා”

(vii) “ඕනෑම දෙයක් කරන්න පුළුවන්. මට උවමනා රක්ෂාවක් විතරයි.”

(ලකුණු $03 \times 4 = 12$ යි.)

(i) දඹදෙණි රාජධානි සමයේ ධර්මසේන හිමියන් විසින් රචිත සද්ධර්මරත්නාවලියේ මට්ටකුණ්ඩලී කථාවස්තුවෙන් උපුටා ගන්නා ලදි. දරුවා නැති වීමෙන් අදින්නපුබ්බක හඬමින් සිටින විට නුදුරෙහි මට්ටකුණ්ඩලී ද හඬනු දකියි. එවිට තමා හඬන කාරණය කියා ඔහු හඬන්නේ කුමක් නිසා දැයි අදින්නපුබ්බක බ්‍රාහ්මණයා විසින් සොහොන ළඟ දී මට්ටකුණ්ඩලී දිව්‍ය පුත්‍රයාගෙන් අසන ලද්දකි.

(ii) දඹදෙණි රාජධානි සමයේ මයූරපාද පරිවේණාධිපති බුද්ධපුත්‍ර හිමියන් විසින් රචිත පූජාවලියේ ජීවක වෛද්‍යවරයාගේ කථාවස්තුවෙන් උපුටා ගන්නා ලද්දකි. සාලවතී නම් ගණිකාවට පුත්‍රයකු උපන් අවස්ථාවේ ඒ දරුවා හදා වඩා ගැනීමේ අපේක්ෂාවක් නැති හෙයින් කසළ ගොඩෙහි දමන්නැයි එම ගණිකාව විසින් සේවිකාවට කියන ලද්දකි.

(iii) කුරුණෑගල රාජධානි සමයේ රචිත ජාතක පොතෙහි එන චන්දකින්නර ජාතකයෙන් උපුටා ගන්නා ලද්දකි. බරණැස් රජු බෝසත් කිඳුරාට විද සිහි මූර්ච්ඡා වූ අවස්ථාවේ කිඳුරා මිය ගියේ යයි සිතා කිඳුරිය විසින් බරණැස් රජුට කියන ලද්දකි.

(iv) ගම්පොළ රාජධානි සමයේ II වන ධර්මකීර්ති හිමියන් විසින් රචිත සද්ධර්මාලංකාරයේ ස්වර්ණතිලකා වස්තුවෙන් උපුටා ගන්නා ලද්දකි. තමා විවාහ කර ගැනීමට ස්වර්ණතිලකා අකැමැති වූ විට රජු වෙත ගොස් කරුණු පැවසූ අවස්ථාවෙහි එම බ්‍රාහ්මණ පුත්‍රයා විසින් රජුට කියන ලද්දකි.

(v) ලෙනාර්ඩ් වුල්ෆ් විසින් රචිත බැද්දේගම නවකතාවෙන් උපුටා ගත් පාඨයකි. සිලිඳු තම දියණිය වන පුංචිමැණිකාට පැවසූ කතන්දරයෙහි එන වනාන්තරයේ දී හමු වූ කොටි දෙන ඌරු පැටියා රැගෙන ගසට නැග සිටි අවස්ථාවෙහි ගස මුල සිටි ඊරියට කළ ප්‍රකාශයකි.

(vi) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර විසින් රචිත "පෙමතො ජායතී සොකො" නාට්‍යයේ එන උද්දාල බමුණා ස්වර්ණතිලකා දැක හටගත් කම්පනයෙන් තම ශිෂ්‍යයන්ගෙන් උපදෙස් පැතූ අවස්ථාවේ දී ශිෂ්‍ය අග්නිදත්ත විසින් නැගූ ප්‍රශ්නයට පිළිතුරු දෙන අවස්ථාව හා සම්බන්ධ වේ.

(vii) කේ. ජයතිලකගේ 'නොනිමි සිත්තම' කෙටි කතාවෙන් උපුටාගත් පාඨයකි. අසංගගේ කාර්යාලයට පැමිණෙන තරුණිය වන ශීලා විසින් තමාට රැකියාවක් ලබා දෙන ලෙස කරනු ලැබූ ඉල්ලීමෙන් පසු ඇයට කළ හැකි මොනවා දැ'යි අසංග ඇසූ විට ශීලා විසින් අසංගට කළ ප්‍රකාශයකි.

**(එ)** **පහත දැක්වෙන කාව්‍ය නිර්මාණයෙහි වස්තු විෂයයෙහි සහ භාෂා ව්‍යවහාරයෙහි විශේෂතා කෙරෙහි අවධානය යොමු කරමින් එම නිර්මාණය පිළිබඳ රසාස්වාදයක් කරන්න.**

'දුදනො'ද බිඳ
බඳ තෙද කඳ
කඳ දෙව් රද
සාමිනේ,
මගෙ කුකුළා නැසූ එකා
දදය ඔබ ගෙ පාළු යකා
තව එක බුද දිනක් තකා
ඉන්නට ඉඩ නො දී මකා,
බලා එල්ල
හෙළුව හෙල්ල
මුලැ මැ බෙල්ල
මරු තැනේ,
කතර ගමට රුහුණු රටේ
හිඟා කකා, ලබන විටේ,
පයින් මැ ගොස් ඇවිදැ වටේ,
පොළොවැ උලා නළල් ඇටේ,
දිගට ඇදී
නැඟැ පැහැදී
මහ හඬ දී
"දෙවියනේ,"
රනින් කුකුළු රුවක් පුදමි
රිදියෙන් බිජු වටක් පුදමි
රන් දුනු හී දෙකක් පුදමි
රුවට රිදී රුවක් පුදමි.
"කතර ගමේ
බල මහිමේ
දුටු ද එ මේ?"
හැම තැනේ
කියමින් නම'කුරු ඔබ ගේ,
බොළඳුන් ගෙ ද කිරි තුඬ'ගේ
රඟ දෙන් නට වඩමි අගේ,
එක'තින් හිමි සඳිනි මගේ.
දුදනො'ද බිඳ
බඳ තෙද කඳ
කඳ දෙව් රද
සාමිනේ.'
'මට කළ මේ විපත අනේ
බලා-ගන්නැ දෙවියනේ.
වැජැඹෙන නා මෙ විමනේ
බලන්නැ නා සාමිනේ.'

(ලකුණු 12 යි.)

මේ කාව්‍ය නිර්මාණයෙහි වස්තු විෂයයේ විශේෂත්වය වන්නේ සිංහල ගැමි ජන දිවියේ සැඟවුණු පැතිකඩක් කවියට විෂය කර ගැනීම යි. ගැමි ගැහැනියක තම කුකුළා සොරා ගත් තැනැත්තාට දඬුවම් කරන මෙන් කතරගම දෙවියන්ට කරන කන්නලව්වකි මෙහි වස්තු විෂය වන්නේ. කුකුළා සොරා ගැනීම නිසා ඇයගේ සිතෙහි ජනිත වූ කෝපය පළ ගැනීමේ චේතනාව මෙහි ප්‍රබල අයුරින් නිරූපිත ය. ඇයගේ සිතෙහි ජනිත කෝප වේගය මැනවින් නිරූපණය කිරීමට සමත් වාග්විලාසයක් කවිය සඳහා යොදා ගැනීම නිසා අභිප්‍රේත අර්ථය සාර්ථක ලෙස ධ්වනිත වෙයි.

උපයුක්ත බස කෙටි පදවලින් සහ කෙටි වැකිවලින් ද අනුප්‍රාස ගුණයෙන් ද සමන්විත බැවින් ඇයගේ චිත්ත වේගය ඉන් ප්‍රබල ලෙස ප්‍රකාශිත ය.

නිදසුන් :- දුදනො ‘ද බිඳ
බඳ තෙද කඳ
කඳ දෙව් රද
සාමිනේ

ඇය දෙවියන් හමුවේ කරන මෙම කන්නලව්වෙහි/හැවිල්ලෙහි පෙනෙන එක් විශේෂත්වයක් වන්නේ තමාට කුකුළා අහිමි වීමටත් වඩා දෙවියන්ගේ දදයෙහි සලකුණ පාළු කිරීම බලවත් අපරාධයක් බව පැවසීම යි. සොරාට දඬුවම් කිරීමට දෙවියන් ද පොලඹවා ගැනීමට දරන තැත කාව්‍ය රසයෙන් පිරිපුන් වන සේ ම ගැමියාගේ සිත් හසර ද මැනවින් නිරූපණය කරන්නකි.

මෙහි භාෂා ලක්ෂණ අතර, හෙළ හවුලට ආවේණික අමිශ්‍ර සිංහල භාෂාව යොදා ගැනීම ද දක්නට ලැබේ. හෙළ හවුලේ ලක්ෂණයක් වන ‘ඇ’ කාරය භාවිතය ද විශේෂ කරුණකි. කාව්‍යාකෘතිය යාදින්නක විලාසයෙන් යුක්ත ය.

උපයුක්ත බසෙහි වියරණ රැකීම ද වැදගත් ය. ව්‍යවහාර භාෂාවෙහි වදන් භාවිතය ද මෙහි රස ජනනයට රුකුලක් වී ඇත.

ඉහත කරුණු ඇසුරු කර ගනිමින් රසාස්වාදය ලිවීම අපේක්ෂා කෙරේ.

**(ලකුණු 15යි)**

**2.** **“පුද්ගල චිත්තාභ්‍යන්තරයේ පවත්නා ගූඪ ස්වරූපය විදහා දැක්වීමත් සාර්ථක අවස්ථා නිරූපණයත් සද්ධර්මරත්නාවලියේ කථාවලට නැවුම් ස්වරූපයක් එක් කරයි” නියමිත කථා වස්තු ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න.**

සද්ධර්මරත්නාවලියේ නියමිත කතා ඇසුරෙන් චරිත නිරූපණයේ දී පුද්ගල චිත්ත අභ්‍යන්තරයේ ඇති ගූඪ ස්වරූපය විදහා දැක්වීමත් සාර්ථක ලෙස අවස්ථා නිරූපණය කර තිබීමත් යන කරුණු පිළිබඳ ව සාකච්ඡා කිරීම පිළිතුරෙන් අපේක්ෂා කෙරේ.

මෙහි දී ප්‍රශ්නයට ඇතුළත් ව ඇති අංශ දෙක කෙරෙහි ම අපේක්ෂකයා අවධානය යොමු කළ හැකි නිදසුන් පහත දැක්වේ.

**මට්ටකුණ්ඩලී වස්තුව :-**

අදින්න පුබ්බක බමුණා සිය පුතා වන මට්ටකුණ්ඩලීට දැඩි සෙනෙහසක් දැක්වුව ද ඔහුට පාණ්ඩු රෝගය වැලඳුණු අවස්ථාවේ දී තමා ම වෛද්‍යවරුන්ගෙන් අසා ගත් බෙහෙත් එනම් කොළසුඹුළු ආදිය කකාරා පෙරා දීමෙන් රෝගය උත්සන්න තත්ත්වයට පත් වේ. පසුව තම පුතා මියෙති යි යනුවෙන් ද ඉලව්වට පැමිණි මිනිසුන් තම වස්තුව දැක ලෝභියකු ලෙස සිතති යි ද යන බියෙන් පුතා ගෙයින් පිටත පිළ මත තබයි. එහෙත් ඔහු මිය ගිය විට "අනේ එකම පුතණුවනි" යනුවෙන් සොහොනට ගොස් හඬා වැලපෙයි.

**කුණ්ඩලකේසී වස්තුව :-**

* **චිත්තාභ්‍යන්තරයේ පවත්නා ගූඪ ස්වරූපය**

- රූමත්, කුලවත් හා ධනවත් සිටුදියණිය මරන්නට ගෙන යන සොරෙකුට පෙම් බැඳීම

  උදා :- "ඒ සිටුදුවණියෝ ද මහත් වූ කෝලාහල නිසා හේ කිම් දෝහෝ යි...ඔහු කෙරෙහි පිළිබඳසිත් ඇති ව උඵ ම පතා බතුත් නොකා යානට නැඟී ලා වැද හොත්තෝ ය."

- සිටුදියණිය සොරාගේ සිත් ගන්නට උපායක් වශයෙන් ඔහුගේ ආදරය දිනා ගැනීම සඳහා වෙහෙසීම

  උදා :- " සිටුදුවණියෝත් එවක් පටන් ඔහු සිත් ගන්ට සව්හරණ ලා සැරහීගෙන තුමූ ම ඕහට බත් මාලු පිසති, කවති, පොවති..."

* **සාර්ථක අවස්ථා නිරූපණය :-**

- බුදුන් වහන්සේ මට්ටකුණ්ඩලී වෙත යාම සඳහා සූදානම් වන ආකාරය හා වඩින අවස්ථාව

  උදා : "දෙවන දවස් උදාසන අලතාපිඬෙක ඇති වූ පබළුදළු වැනි වූ දෝහෝ... සකල ශරීරයෙන් සවනක් රැස් විහිදුවමින් මහාකාශ්‍යප ස්ථවිර ප්‍රමුඛ..."

- පිළ මත වැතිර සිටින, මට්ටකුණ්ඩලී අසලට බුදුන් වහන්සේ වැඩම කරන අවස්ථාව

  උදා : "මට්ටකුණ්ඩලීත් බුදුරැස් දැක මියන වේලෙක රුවන්සක්මන මුනි පෙත්තක් ගෙනගොස් සිටුවාලා පෙත්ත දසාවට නමාලූ කලක් මෙන්..."

- සොහොනේ තනි ව හඬමින් සිටිනා අදින්න පුබ්බක බමුණා සමීපයට මට්ටකුණ්ඩලී දෙව්පුත් පැමිණෙන අවස්ථාව.

  උදා : "මට්ටකුණ්ඩලී වෙස මවාගෙන සොහොන්බිම කරා ගොසින් අත හිස තබාගෙන වැත්තා දන්නට ආ නෑකෙනෙකුන් මෙන් හඬහඬා සිටියේය."

- සොර පව්ව මුදුනේ දී සොරා හා කුණ්ඩලකේසී අතර වන සිදුවීම්

  උදා : " සිටු දුවණියෝත් තුන් විටක් පැදකුණු කොටලා සතර තැනෙක සිට වැඳලා..."

- ජම්බු පරිව්‍රාජිකාවන් සැවැත් නුවර වාසල අසල දඹ අත්ත සිටුවා ඇති විට මුගලන් තෙරුන්ගේ කීම පරිදි කුඩා ළමුන් එය මඬින අවස්ථාව

  උදා : "මහතෙරුන් වහන්සේගේ බසින් තුමූ උපන් උත්සාහ ඇති ව අත්ත මැඬ හඬ ගසමින් ධූලි උඩ නංවා පීහ..."

- මුගලන් තෙරුන් හා පරිව්‍රාජිකාව අතර වාදය සිදු වන අවස්ථාව

  උදා :- "නුවර මුළුල්ල අසුරන් වැද ගිය දිව්‍යපුරයක් මෙන් ඇළලී..."

**නැතහොත්**

"ස්ත්‍රී චරිත ස්වභාවයෙහි පවත්නා සංකීර්ණ ලක්ෂණ ප්‍රකට කිරීමත් ඒ සඳහා යෝග්‍ය භාෂා ව්‍යවහාරයක් උපයෝගි කොට ගැනීමත් ඇතැම් ජාතක කථාවල සාර්ථකත්වයට හේතු වී තිබේ." නියමිත කථා වස්තු ඇසුරෙන් විමසන්න. (ලකුණු 15 යි.)

ජාතක කථා කතුවරයා ස්ත්‍රී චරිතවල ඇති සංකීර්ණ ලක්ෂණ සිය කථා මඟින් ප්‍රකට කරන ආකාරයත් ඊට යෝග්‍ය වන භාෂා ව්‍යවහාර යොදා ගන්නා ආකාරයත් ජාතක කථාවල සාර්ථකත්වයට බලපා ඇති අන්දම විමසීම පිළිතුරෙන් අපේක්ෂා කෙරේ.

මෙම පිළිතුර සඳහා නිර්දිෂ්ට කථා ඇසුරෙන් ඉදිරිපත් කළ හැකි නිදසුන් කිහිපයක් පහත දැක්වේ.

**චුල්ලධනුද්ධර ජාතකය :**

* **ස්ත්‍රී චරිතයෙහි ඇති සංකීර්ණ ලක්ෂණ**

- චුල්ලධනුද්ධර, සොරා මැරීමට තම බිරිඳගෙන් කඩුව ඉල්ලා සිටින විට ඇය සොරාට කඩු මිට හා චුල්ලධනුද්ධරට කඩු කොපුව ලබා දීම
- කැණහිල් වෙස් ගත් ශක්‍රයාට සිදු වූ දෙය දැක තමාට සිදු වූ බරපතළ හානිය අමතක කොට මහත් සේ සිනාසීම
- අවසානයේ සිය වරද පිළිගන්නා බව ශක්‍රයාට හට ප්‍රකාශ කිරීම

* **යෝග්‍ය භාෂා ව්‍යවහාරය**

චුල්ලධනුද්ධර ජාතකයේ දැක්වෙන මෙම සංකීර්ණ ස්ත්‍රී ලක්ෂණ නිරූපණය සඳහා කතුවරයා යොදා ගන්නේ වර්ණනාවලින් තොර සරල හා සංක්ෂිප්ත භාෂා රීතියකි.

උදා : "චුල්ලධනුද්ධරයෝ සොඳුර" කඩුව දී ලව" යි අත දික් කොට ලන්නා සොරාට කඩු මිට දී චුල්ලධනුද්ධරයන්ට කොපුව දීලූහ. සොරා චුල්ලධනුද්ධරයන් ඉස කපා මරා යන්ට නික්මුණු කලට ගඟක් සමීපයට පැමිණියාහ."

**චන්දකින්නර ජාතකය :**

* **ස්ත්‍රී චරිතයෙහි ඇති සංකීර්ණ ලක්ෂණ**

- නැටුම් ගැයුම් ආදි කලාවන්ට දක්ෂතා දැක්වූ, මුදු මොළොක් තැනැත්තියක සේ තම ස්වාමියාට අතිශයින් ම ඇලුම් කළ කිඳුරිය තම පෞරුෂය කරණ කොට ගෙන බලවතුන්ට එරෙහි වීමට බිය නොවීම
- බරණැස් රජු කෙරෙහි අතිශයින් ම ද්වේශ සහගත වීම හා ගර්වයෙන් යුක්ත වීම

* **යෝග්‍ය භාෂා ව්‍යවහාරය**

- මෙවැනි ගති ලක්ෂණ නිරූපණය කිරීමේ දී කතුවරයා යොදා ගන්නා භාෂා ව්‍යවහාර චුල්ලධනුද්ධර ජාතකයට සාපේක්ෂ ව බෙහෙවින් වෙනස් වේ. චන්දකින්නර ජාතකය කථාවේ පහත දැක්වෙන නිදසුන් ඉහත කරුණු සනාථ කිරීම සඳහා යොදා ගත හැකි ය.

* **වර්ණනා බහුල වීම**

උදා :- “කින්නරාංගනා මහරී මල්දම් බඳු වූ මොළොක් අත් නැමීමෙන්, නැඟීමෙන් , හෙළීමෙන් නුදුරු තැන්හි සිට....”

“පස් පියුමෙන් ලකළ විල් තටාක පංක්තියෙන් ද ආමූලාග්‍ර ව පිපී වැනී ගියා වූ නදුන්, සඳුන්, කළුවැල් දෙව්දුරු තුවරලා ආදි වූ නොයෙක් සුවඳ රුකින් ගැවසී ගත්....”

- කිඳුරියගේ භාව නිරූපණය සඳහා උචිත බස් වහරක් උපයෝගි කර ගැනීම

  උදා : “ අවලක්ෂණය, තෝ මා නිසා නිරපරාධ වූ මාගේ සමණා මැරී ද ?
  පෙර තා හා සමඟ කෙළ ඇවිදිනා බව වැටහෙන බව මුත් ඉනිබ්බ තාගේ විරහ ශෝක දුක්ඛයෙන් හඬන ලද්දා වූ මට අනේ අඳුරු ගෙයක් මෙන් නිස්සෝභාව වැටහෙන්නේ ය.”

- කිඳුරියගේ වැලපුමේ දී අනුප්‍රාසවත් පද හා තත්සම පද බහුල භාෂා රීතියක් යොදා ගැනීම

  උදා :- “කිමෙක් දෝ හෝ මෙලෝ රක්නා වූ ලෝකපාල දෙවියෝ නැත් ම දෝ හෝ....”
  “පුෂ්ප ඵල පල්ලවයෙන් අලංකෘත වූ වන ලැහැබුන් හා....”
  “අනේ හිමියෙනි, යක්ෂරාක්ෂසිද්ධවිද්‍යාධරාදි වූ නානා භූත ගණයන්ගේ වාසස්ථාන වූ ද....”

**මෙවැනි තවත් උචිත නිදසුන් පිළිතුර සඳහා යොදා ගත හැකි ය.**

**3.** “අතෘප්තිකර ආශාවන් සපුරා ගැනීමට යාම හේතුවෙන් පුද්ගලයින් පරිහානියට පත් වීම හා එබඳු සිදුවීම් පැහැදිලි කිරීම සඳහා යෝග්‍ය ධර්මෝපදේශ යොදා ගැනීම සද්ධර්මාලංකාරයේ කැපී පෙනෙන ලක්ෂණ වේ.” නියමිත කථා ආශ්‍රයෙන් පිරික්සන්න. **(ලකුණු 15 යි)**

යහපත් ජන සමාජයක් ගොඩ නැගීම මූලික අරමුණ කර ගත් සද්ධර්මාලංකාර කතුවරයා, අතෘප්තිකර ආශාවන් සපුරා ගැනීමට යාමේ දී පුද්ගලයන් පරිහානියට පත්වීම හා එබඳු සිදුවීම් පැහැදිලි කිරීම සඳහා යෝග්‍ය ධර්මෝපදේශ ලබා දුන් ආකාරය නිර්දිෂ්ට කථා මගින් පිරික්සා බැලීම පිළිතුරෙන් අපේක්ෂා කෙරේ.

ඒ සඳහා යොදා ගත හැකි නිදසුන් පහත දැක්වේ.

**ස්වර්ණතිලකා වස්තුව**

- බ්‍රාහ්මණයාගේ පුත්‍රයා විසින් ගෙනෙන ලද විවාහ යෝජනාව ප්‍රතික්ෂේප කොට ඔහුට අපහාස කිරීම හා තම රූසපුවෙන් උදම් වී වංශවතකු ප්‍රාර්ථනා කිරීම හේතුවෙන් රජුගෙන් අභියෝගයක් ලත් ස්වර්ණතිලකා උත්තර මධුරා පුරයෙන් පිට ව යාම

- උද්දාල බමුණා තමා කෙරෙහි වසඟ කරවා ගැනීමට ඇය කටයුතු කිරීම හා ඔහුගේ භාර්යාව වීමේ අවසන් ප්‍රතිඵලය ලෙස අකල් මරණයට ගොදුරු වීම

- උද්දාල බමුණා ස්වර්ණතිලකා කෙරෙහි අතිශයින් ම ඇලුම් සහගත වීම හේතුවෙන් සිය වගකීම් පැහැර හැරීම හා අවසානයේ දී සියදිවි හානි කර ගැනීම

- ස්වර්ණතිලකාට වසඟ වන රජවරුන් සිය සිතැඟි සපුරා ගත නොහැකි ව සියතින් දිවි හානි කර ගැනීම
- මෙවැනි සිදුවීම් ඇසුරින් සද්ධර්මාලංකාර කතුවරයා වශයෙන් තමා ද කතාවෙහි ඇතුළත් චරිත ලවා ද ධර්මෝපදේශ ලබා දෙන ආකරය දක්නට ලැබේ

  උදා : "කිමෙක් ද ආචාරීනි, ඉතා ළං විය නොහැකි දුගඳ පිළිකුල් වූ අපවිත්‍ර අමේධ්‍යය හා මනෝඥ වූ සුවඳ විහිදුනා සිහිල් සඳුන් හා දෙක කවර කලෙක කෙසේ නම් එක් වේ ද?... එක් නුව මනා හීනජාතීන් හා සහවාසය කරන්නා වූ උත්තම සත්ත්වයාගේ ශ්‍රී කාන්තාව ය කීර්තිය, ආයුෂය, ශරීර බල ය, නුවණ ය යන මෙකී සියල්ල ම ඔහු අත්හැර දුරු ව පලා යන්නේ ය."

  "එබැවින් ස්ත්‍රීන්ගේ වසඟත්වයට පැමිණියා වූ කාමී පුරුෂයෝ පරලොව විඳිනා අපාය දුක් තබා මෙම ජාතියෙහි මෙසේ නොයෙක් වැසන විඳ මරණයටත් පැමිණෙනන්නාහු ම ය."

**නන්දිවාණිජ වස්තුව**

- වෙළෙඳ භාර්යාවට වසඟ වන අමාත්‍යවරයා ඇය දිනා ගනු පිණිස නොයෙක්වර පඬුරු යැවීම හා වෙළෙඳ භාර්යාවගේ ප්‍රතිචාර හමුවේ සිය ආත්ම ගරුත්වයට හානි සිදු කර ගැනීම.

  උදා : "මේ ලජ්ජා නැති මිනිසෙක්; දැන් මා ඔහු තද කොට වැළකුව මැනව" යි සිතා.

- නන්දිය වෙළෙන්දා මිය ගිය කල ඔහුගේ බිරිඳ තමා සතු කර ගත හැකි වෙති'යි සිතා ශිව ඇමතියා ඒ වෙළෙන්දා මරණයට පත් කිරීම සඳහා යකැදුරකු යෙදවීම හා ආවේශ වූ යක්ෂයාට තමා ම බිලි වීම.

  උදා :- "සතර වන වාරයෙහි ආවේශ කරවා නික්මවූ කල්හි ගොසින් වෙළෙඳාණන් කරා වැද්ද නොහී ආපස්සේ ඇවිත් ආමාත්‍යයා හා යකදුරා දෙපළු කොට පොලු ගසා අවේශ ව ගිය මිනියත් එතැන ම එළා ගිය."

  කතුවරයා මෙහි දී දිය යුතු ධර්මෝපදේශ තමා ම ද නන්දිය වෙළෙඳ භාර්යාව ලවා ද ඉදිරිපත් කර ව යි.

  උදා : "එම්බා නැඟණියෙනි, මේ අනුන් සන්තක වස්තුවෙහි වරදවා පිළිපදනේ ය යි තොපගේ අමාත්‍යයාණන්ටත් නුගුණ ය; මෝ තොම තමාගේ ගෙහිමියා ඉක්ම පවත්නී ය යි මටත් නින්දා වන්නේ ය."

  "මෙකී පරිද්දෙන් යම්කිසි නුවණැති ශ්‍රද්ධාවන්ත උත්තමයාණ කෙනෙක් සියලු විපත්තියට ඒකාන්ත කාරණ ව සිටි කාමරාගය දුරු කොට හැර ස්වල්පමාත්‍ර වූ කුශලයක් කළාහු වී නම් එබඳු උත්තමයෝ ස්වර්ග, මර්ත්‍ය, පාතාල යන තුන්ලෝ බබුළුවන්නාහු මැයි."

**නැතහොත්**

"ළමයින්ගේ චිත්ත ස්වභාවය නිරූපණය කරන ආකාරයත් යහපත් සමාජාශ්‍රය හේතුවෙන් ඔවුන් තම ජීවිත සාර්ථක කර ගන්නා ආකාරයත් පූජාවලියෙහි ඇතැම් කථා මගින් ප්‍රකට කෙරේ." නියමිත කථා ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි.)

පූජාවලියෙහි ඇතැම් කතාවල ප්‍රමුඛ වශයෙන් නිරූපණය වන්නේ ළමා චරිත ය. එහි දී ඔවුන්ගේ චිත්ත ස්වභාවය තාත්වික ලෙස නිරූපණය කරන කතුවරයා යහපත් සමාජ ආශ්‍රයෙන් ඔවුන් තම ජීවිත සාර්ථක කර ගන්නා ආකාරය පෙන්වා දෙයි.

මේ පිළිතුර සැකසීමේ දී නිර්දිෂ්ට කතාවල ඇතුළත් පහත දැක්වෙන කරුණු කෙරෙහි අවධානය යොමු කළ යුතු ය.

**අනුරුද්ධ කුමාර කථාව**

- ගුළ කෙළියෙන් පැරදි කෙනකු කැවුම් තලි දිය යුතු ය යන ගිවිසුම අනුව කුමාරවරුන් ක්‍රීඩාවේ යෙදීම
- දේවතාවා මැවූ කැවුම් කන අනුරුද්ධ කුමාරයා එහි රසයෙන් පිනා ගොස් කෙළිය නවත්වා, මව ළඟට දිවගොස් සැමදා තමාට 'නැතිපූ' දෙන ලෙස පවසා නැවත කෙළියට ඒම
- බත් උපදින තැන් පිළිබඳ ව කුමාරවරුන්ගේ මත ඉදිරිපත් කරන ආකාරය - එනම් බඩසලින්, සැළියෙන් හා මහරන්තලියෙන් බත් උපදනේ යයි සිතීම
- අනුරුද්ධ කුමාරයා මහණ වීම ප්‍රතික්ෂේප කිරීමට හේතු ඉදිරිපත් කරන ආකාරය
- මහානාම කුමරු ගිහි ජීවිතයේ ස්වරූපය හා උපයා කෑමෙහි දුෂ්කරතා පෙන්වා දීමෙන් අනතුරු ව අනුරුද්ධ කුමරයා මහණවීමට එකඟ වීම
- අනුරුද්ධ කුමරයාගේ ප්‍රඥාවන්ත ක්‍රියා කලාපය හේතුවෙන් තවත් රාජ කුමාරවරුන් පස් දෙනකු බුදුසසුනට ඇතුළත් වීමට එකඟ වීම හා ඔවුන් උසස් මාර්ගඵල ලබා ගැනීම

**ජීවක වෛද්‍යවරයාගේ කතාව**

- ජීවක කුඩා කල කෙළිමඬලේ දී ඔහුට මවක නැති වීම පිළිබඳ ව සෙසු කුමාරවරුන් උසුළු විසුළු කිරීම
- තමා හදා වඩා ගත් දරුවකු බව දැනගන්නා ජීවක තම අනාගත ස්ථාවරත්වය සඳහා ශිල්පයක් හැදෑරීමට තීරණය කිරීම. ඒ අනුව වෛද්‍ය වෘත්තිය වෙත යොමු වීම

  උදා : "වෛද්‍ය ශිල්පය හදාරා ගතිම් නම් වෛද්‍යාචාරිය යන නම් ඇසූ කල ම සත්ත්වයෝ මවුන් පියන් ගුරුන් කොට ම සිතා......"
- දිසාපාමොක් ආචාර්යවරයා, තමාගේ තොරතුරු දැන ශිල්ප ලබා නොදෙති'යි යන බියෙන් සත්‍ය තොරතුරු වසන් කිරීම හා ධර්මාන්තේවාසික ව ඉගෙනීමට කැමැත්ත ප්‍රකාශ කිරීම
- තම ශිල්පය නිසි ලෙස හදාරා අවසන් කරන ජීවකහට ඇදුරුතුමාගේ ආශීර්වාදය හිමි වීම හේතුවෙන් සිය දක්ෂතා පෙන්වීමට අවස්ථාව උදා වීම

උදා :- "...මෝහට මාගෙන් උපකරණ දී, මිනිසුන් දී සිය නුවරට යැවීම් නම් මොහුගේ ශිල්පානුභාවය නොපෙනේ"යි සිතා"

- සාකේත නුවර සිටු යුවළ, අභය රාජ කුමරු, බිම්බිසාර රජු හා නොයෙක් සිටුවරුන් ඇසුරෙන් ජීවකහට උසස් ජීවන තත්ත්වයක් උදෙසා අවශ්‍ය පසුබිම් සැකසීම

**4.** (අ) විවිධාංගවලින් පෝෂිත පද්‍ය සාහිත්‍යයක් කෝට්ටේ අවධියෙහි දක්නට ලැබේ. එබඳු විවිධාංග **තුනක් වත්** ඇසුරෙන් මේ මතය විමර්ශනය කරන්න. (ලකුණු 07 යි.)

සිංහල පද්‍ය සාහිත්‍ය ඉතිහාසයේ ඉතා වැදගත් අවධියක් ලෙස කෝට්ටේ රාජධානි සමය හැඳින්විය හැකි ය. විවිධ කාව්‍ය ග්‍රන්ථ රාශියක් මේ අවධියේ නිර්මාණය වීම එහි අගය වර්ධනයට හේතු වී ඇත. අපේක්ෂිත පිළිතුරෙහි එම කාව්‍ය ග්‍රන්ථ පිළිබඳ අවබෝධයකින් යුක්ත ව විමර්ශීලී ව කරුණු සාකච්ඡා වී තිබීම අවශ්‍ය වේ.

- විශිෂ්ට සන්දේශ කාව්‍ය කිහිපයක් ම ඒ අවධියෙහි රචනා වී තිබීම
  - පරෙවි සන්දේශය, සැලළිහිණි සන්දේශය, හංස සන්දේශය, ගිරා සන්දේශය, කෝකිල සන්දේශය
- මහා කාව්‍යය - කාව්‍ය ශේඛරය
- ඛණ්ඩ කාව්‍යය - ගුත්තිල කාව්‍යය
- උපදේශ කාව්‍යය - ලෝවැඩ සඟරාව
- බුදුගුණ කාව්‍යය - බුදුගුණාලංකාරය
- ප්‍රශස්ති කාව්‍යය - පැරකුම්බා සිරිත
- ප්‍රහේලිකා කාව්‍යය - දහම් ගැට මාලාව

**ඉහත පද්‍ය කාව්‍ය ප්‍රභේදවලින් තුනක් පිළිබඳ ව වත් කරුණු දක්වා තිබීම අපේක්ෂිත ය.**

(ආ) "අවස්ථානුකූල ව විවිධ වර්ණනා යොදා ගැනීමත් ඒවා ශබ්දාර්ථ රසයෙන් විචිත්‍රවත් කිරීමත් හේතු කොට ගෙන ගුත්තිල කාව්‍යය පාඨකයාගේ සිත් ගනී." විමර්ශනය කරන්න. (ලකුණු 08 යි.)

මූලික අංශ දෙකක් යටතේ කරුණු දැක්වීම මෙහි දී අපේක්ෂිත යි.

1. අවස්ථානුකූල වර්ණනා භාවිතය
2. ඒවා ශබ්දාර්ථ රසයෙන් අනූන වීම

ගුත්තිල කාව්‍යයෙහි අවස්ථා වර්ණනා ලෙස පහත අවස්ථා දැක්විය හැකි ය.

i. සැණකෙළි වැනුම : සැණකෙළියෙහි නිරත වූවන්ගේ හැසිරීම්වල ස්වභාවය, ඒවාහි සජීව ස්වරූපය විස්තර කිරීමට කතුවරයා දක්වන දක්ෂතාව පැහැදිලි කෙරෙන පද්‍ය

* "සදවා සුදු වැලි පිවිතුරු..."
"කියමින් ගී රස මියුරු..."
"රැගත් සුරා පිරූ විතින්..."

ii. මූසිල බරණැස් පුරයෙන් පැමිණි වෙළෙඳුන් හමුවේ වීණා වාදනය කිරීම දැක්වෙන අවස්ථාව. මූසිලගේ අරමුණ ප්‍රකට කෙරෙන සිතුවිලි පවා එම පද්‍යයන්ගෙන් දැක්වේ.

* "බසෙකින් නොදන්නා..."
  "සැරයට ළං නොවන..."
  "නොමිහිරි ද මේ වෙණ..."

iii. මූසිල ගුත්තිල ඇදුරුතුමන් හමුවීමට පැමිණි අවස්ථාව, මූසිලගේ හැසිරීම, අඳ මාපියන් දක්වන ප්‍රතිචාර, මූසිලගේ වීණා වාදනය උපහාසයට ලක් කරන අයුරු පැහැදිලි වන පද්‍ය

* "අඳ මව් පිය දෙදෙන..."
  "ඒ අසා වෙණ තබා..."
  "හිමි තම නැණ නැවින්..."

iv වීණා වාදන තරග අවස්ථාව වර්ණනා කිරීම, වාද්‍ය මණ්ඩපය සැරසූ ආකාරය, රැස්වූ පිරිස වර්ණනා කිරීම

* "සුදු පිරිසිදු වියනුත් උඩ බඳවා..."
  "සුවඳින් බිම පිරිබඩ ගෙන මොනවට..."
  "බීම සිට බැලීමට..."
  "ඇවිත් පසු පස්සේ..."

v. ගුත්තිලගේ වීණා වාදනය උච්චාවස්ථාවට පත් වීමත් සමඟ සුරඟන රැඟුම් විචිත්‍රවත් වන අයුරු මැනවින් වර්ණිත ය.

* "ළඟ ළඟවා උනුනට කර වාදය..."
  "යටැසින් ලන බැල්මෙන් සුරවිලසී..."
  "රූ රැසේ අඳිනා ලෙසේ අත් ලෙළ දිදී විදුලිය පබා..."

යනාදි වැනුම් ආශ්‍රයෙන් උචිත පද්‍යවල, උපමා-උපමේය, රූපක, ස්වභාවෝක්ති, චිත්තරූප මැවීම, විරිත් භාවිතය, එළිසමය, අනුප්‍රාසය ආදි කාව්‍යෝපක්‍රම භාවිත කොට ඇති අයුරු පිළිතුරෙහි දැක්විය යුතු ය.

මෙහි ලා අදාළ නිදසුන්වලින් ශබ්දාර්ථ රසය මතුවන අයුරු පැහැදිලි කර තිබිය යුතු ය.

**5.** බැද්දේගම නවකතාවේ කේන්ද්‍රීය චරිතය වන සිලිඳු, වනසතුන් හා තම දියණියන් දෙදෙනා සමගත් ගම්වැසියන් සමගත් පැවැත්වූ සබඳතාවල ස්වභාවය නිදසුන් ආශ්‍රයෙන් වෙන වෙන ම පැහැදිලි කරන්න. (ලකුණු 15 යි.)

- සිලිඳු වනාන්තරයේ දී හමුවන සතුන්ගේ චර්යාවන් පමණක් නොව ඔවුන්ගේ සිතුම් පැතුම් ද මැනවින් හඳුනන චරිතයක් ලෙස නවකතාවෙහි නිරූපිත ය. වන සතුන්ගේ බස සහ ඉරියව් සියල්ල ඔහුට හොඳින් තේරුම් ගත හැකි ය. දඩයක්කරුවකු වුව ද සතුන් සහ සිලිඳු අතර පැවතියේ සුහද සබඳතාවකි.

  උදා :

  i. "මොකද නංගියෙ බඩ හිස් වෙලා ද?" කියලා. එතකොට ඈ කීවා " යකෝ, දැන් දවස් තුනක් වෙනවා මට මරා ගන්ඩ ලැබුණේ එකම වඳුරෙක් විතරයි."

  ii. "....අල්ලා ගත්ත ඌරු පැටියා ගේ අම්මා මහ ඊරි පලු ගහේ කඳට අත් දෙක දීගෙන යකින්නියට කතා කරලා කීවා..."

  iii. "උඹලා තව ළපටි වැඩි යි. කැලේ පාරවල් දන්නේත් නැහැ.... තිරිසන් සතුන් කතා කරන්නේ මිනිහෙක් අවුරුදු ගාණක් කැලේ ම ජීවත් වුණා ම...."

- තම බිරිඳ දියණියන් ප්‍රසූත කළ පසු සිලිඳු වියරුවෙන් මෙන් හැසිරුණේ ය. එහෙත් ඔවුන් තුන් අවුරුදු වයස ඉතුක් වන කාලයේ දී දරු සෙනෙහසින් ළඟට ගෙන ආදරයෙන් අමතා වනාන්තරය පිළිබඳ විවිධ කථා කියා දෙන්නට විය. දියණියන් දෙදෙනා ද ඔහුට අසීමිත ලෙස ආදරය කළ අතර, පියා සහ දියණියන් අතර ස්නේහය දැඩි බන්ධනයක් බවට පත් වූ අයුරු නිරූපිත ය.

  උදා : i. "...ගෙඹි පැටිත්තියේ ඇයි උඹ විල අත් ඇරදාලා ආවේ? උඹේ මේ පුංචි බඩට ඇතිවෙන්ට කෑම නැද්ද ඒකෙ... උඹ ඇවිත් තියෙන්නෙ යක්කුත් අතුරු අන්තරාත් වැඩි නරක ම තැනකටයි...."

  ii. "...දරුවන් වැඩුණු පසු, වනයට යන විටෙක ඔවුන් ද පස්සෙන් අඬගාගෙන කැටුව යාම සිලිඳුගේ සිරිත විය."

  iii. "...ඔව් දෙයියෝ තමයි මේකා දුන්නේ. මං ඊයේ රෑ හඳපානෙ වතුර කඩක් ගාව රැකගෙන හිටියා...."

- සිලිඳු හා ගම්වැසියන් අතර පැවතියේ සීමිත සම්බන්ධයකි. එය ද ආරච්චි, පුංචිරාළ, බබුන් ආදීන් සමඟ පමණක් වී ය.

- ගම්වැසියන් සියලු දෙනා සිලිඳු දෙස බැලුවේ අවඥා සහගත දෘෂ්ටියකිනි. ඔහුට ටිකක් පිස්සු යැයි ගම්මු කීහ. අසාමාන්‍ය ගති ඇති, අලස කම්මැලි චරිතයක් ලෙසිනි සිලිඳු ගම් වැසියන්ගේ විනිශ්චයට ලක් වූයේ.

උදා :i "...ඔහුට ටිකක් පිස්සු යි ගම්මු කීවෝ ය."

ii. "... - අනික් ගම්මුන් කී හැටියට වැදි ගෙදර - කෝඩයකට හසු වූ කලෙක මෙන් පෙනිණ."

iii. "...ණය තුරුස්වලට සිලිඳු හොඳ මිනිහකු නොවන හෙයින්."

ඉහත කරුණු සාකච්ඡා කරමින් ලියූ පිළිතුරක් මේ ප්‍රශ්නයේ දී අපේක්ෂිත ය.

**6.** "කෙටිකතා මාධ්‍යයෙහි සියුම් හා කලාත්මක ලක්ෂණ පිළිබඳ මනා පරිචයත් සමකාලීන ලාංකේය සමාජයෙහි යථා ස්වභාවය ගැඹුරින් ප්‍රතිනිර්මාණයත් නූතන කෙටිකතා රචකයන්ගේ නිර්මාණවල කැපී පෙනෙන ලක්ෂණයකි." නියමිත කතා **තුනක් වත්** ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි.)

නූතන කෙටිකතා රචකයන් කෙටිකතා මාධ්‍යයෙහි සියුම් වූත් කලාත්මක වූත් ලක්ෂණ පිළිබඳ මනා පරිචයකින් යුතු ව සමකාලීන ලාංකේය සමාජයෙහි යථා ස්වභාවය ගැඹුරින් ප්‍රතිනිර්මාණය කරන්නට යොමු වී ඇති ආකාරය සාකච්ඡාවට බඳුන් කිරීම මෙම පිළිතුරෙන් අපේක්ෂා කෙරේ.

කෙටිකතාවේ ශිල්පීය ක්‍රම හෙවත් කලාත්මක ලක්ෂණ ලෙස සැලකෙන්නේ වස්තු වින්‍යාසය, චරිතාංග නිරූපණය, පසුබිම් නිරූපණය, සංකේත භාවිතය, දෘෂ්ටිකෝණය, ජීවන දෘෂ්ටිය හා නිර්මාණාත්මක භාෂාව යනාදි අංග යි. මෙම ලක්ෂණ නූතන කෙටිකතා රචකයන් මනා පරිචයකින් යුතු ව භාවිත කර ඇති ආකාරය ගැන නිදර්ශන කිහිපයක් හෝ ඉදිරිපත් කිරීමට අපේක්ෂකයාට හැකි විය යුතු ය.

ලාංකේය සමාජ යථාර්ථය ගැඹුරින් නිරූපණය කර ඇති කෙටිකතා ලෙස වෙසක් පහන කෙටිකතාව හැර අනෙක් සියලු නිර්දිෂ්ට කෙටිකතා පිළිතුරට යොදා ගත හැකි ය. එයට නිදර්ශන කිහිපයක් පහත දැක්වේ.

**කරත්තය** - 1980 ගණන්වල දී සිදු වූ රාජ්‍ය විරෝධි කැරලි පසුබිම් කරගෙන ලියැවුණු මෙම කෙටිකතාවෙන් සමකාලීන සමාජ, දේශපාලන පරිසරයෙහි යථා ස්වභාවය ප්‍රතිනිර්මාණය කොට තිබේ. සමකාලීන සමාජ දුබලතා හේතුවෙන් පීඩනයට පත් තරුණ පරපුරේ අපේක්ෂා මානව දයාවෙන් යුතු ව විවරණය කරන්නේ කෙටිකතාවේ ශිල්පීය ලක්ෂණ පිළිබඳ කතුවරයාගේ මනා පරිචය ද ප්‍රකට කරමිනි.

කෙටිකතාවෙන් නිරූපිත කලාත්මක ලක්ෂණ

- සජීව අවස්ථා නිරූපණය - කතා පුවතට නොව සිද්ධි නිරූපණයට මුල් තැනක් දෙන මෙම කෙටිකතාවේ අවස්ථා හා සිද්ධි තුළ ත්‍රාසය ද, කුතූහලය ද, උත්ප්‍රාසය ද ගැබ් ව ඇත.

උදා :- "රාළහාමි නැගිට්ටේ ය. අඩි හය හතක් දිග මේසය වටා දිගු අඩි තබමින් කොට බිත්තිය පිටුපසින් කරකැවී එත් ම කරත්තකරු අන්දමන්ද වී පිටුපස බැලුවේය...."

- චරිතාංග නිරූපණය
කතුවරයා කරත්තකරුගේ චරිත ලක්ෂණ යථාර්ථවත් ලෙසත්, අපූර්ව ලෙසත් ප්‍රතිනිර්මාණය කරයි.
උදා :- "මං සෙනසුරාදට ඔය ගාවට යනවා - ගොනා හොඳට නාවනවා - බල්ලත් නාවනවා - එතන හොඳ හෙවණ...."

"අද මා මෙහි මූත්‍රා කළත් මගේ බල්ලා මූත්‍රා කරන්නේ බොහෝ ඈතට ගොස් මා දෙස බලා වරදක් නැතැ යි හැඟුණ පසු ය...."

- උත්ප්‍රාසවත් සංවාද නිර්මාණය

උදා : "තමා ඒ කාලේ ඔච්චර හොඳට ඉගෙන ගෙන ඇයි රස්සාවකට නො ගියෙ?"
"ඇයි මම රස්සාවක් කරනවා."
"මම අහන්නේ උගත්කමට ගැළපෙන රස්සාවක්?"
"එහෙම එකක් තියෙනව ද?"

- නාට්‍යමය ආකෘතියක් යොදා ගැනීම

**නොනිමි සිත්තම** - කලාවේදියකුගේ සියුම් අධ්‍යාත්මය හෙළි කෙරෙන මෙම කෙටිකතාව මගින් වර්තමානයේ දී නිර්ව්‍යාජ කලාකරුවකු වෙත සමාජයෙන් හා සිය පවුලෙන් ප්‍රදානය කෙරෙන්නේ කුමක් ද? යන පැනය කෙරෙහි පාඨකයාගේ අවධානය යොමු කෙරේ. පුද්ගලයාගේත්, පොදු සමාජයේත් ඇතැම් ක්‍රියාකාරකම් කතුවරයා විවරණය කරන්නේ උපහාසාත්මක දෘෂ්ටියකිනි.

- චරිතාංග නිරූපණය
  අසංග හා මාලනීගේ චරිත ඒවායේ ප්‍රතිවිරුද්ධ ලක්ෂණ අනාවරණය වන පරිදි නිරූපණය කර ඇත. අසංගගේ චෛතසික නිරූපණය මගින් මාලනීගේ විපර්යාසය පිළිබඳ තැවුල ද පොදු සමජය විෂයයෙහි කළකිරීම ද ධ්වනිත කරවයි.
- නිර්මාණශීලි භාෂාව
  "ඇගේ අතිධවල සුදු ඉංගිරියාව මැද දීප්තිමත් කළු ඉංගිරියාව ඔබ මොබ දුවන සැටි! පස් විසි හැවිරිදි ගුරුවරයාගේ හදවත ඉන් හීයකින් මෙන් පසාරු කරගෙන යයි"
  "රත්පැහැ ළා රෝස දල්ලක් මෙන් මෑ සිටියේ මොන තරම් මුදු මොළොක් ගතියකින් ද? කෙමෙන් කටු මෝරා රොස් පරොස් වී ගියේ කී දවසට ද?"
- දෘෂ්ටිකෝණය - ප්‍රථම පුරුෂ දෘෂ්ටිකෝණය යොදා ගෙන ඇත්තේ අසංගගේ චිත්තාභ්‍යන්තරය හෙළිදරව් කෙරෙන පරිදි ය.

**ස්නේහය** - මෙම කෙටිකතාව මගින් නිරූපණය කරනුයේ දාරක ස්නේහයේ අසීමාන්තික බව යි. ගැමි පරිසරයක් කෙටිකතාව සඳහා පසුබිම් කර ගන්නා රචකයා වියළි කලාපීය දුෂ්කර ගම්මානයක ජීවන පරිසරය, පුද්ගල සිතුම් පැතුම්, භාෂා ව්‍යවහාර ආදිය කතා තේමාවට අනුකූල වන පරිදි යථාර්ථවත් ලෙස ප්‍රතිනිර්මාණය කරයි.

- චරිතාංග නිරූපණය
  රංකිරා, පිංචිමහයියා ආදි චරිත මෙවන් ගැමි පසුබිමක දී මුණගැසෙන ජීවමාන චරිතට බවට පත් වී තිබේ. තරුණ කල තම එක ම දරුවා සිය ලෝකය බවට පත් කර ගත් පිංචිමහයියාට දැන් මුළු කාලය, ශ්‍රමය යෙදවීමට සිදුව ඇත්තේ සැමියා වෙනුවෙනි. එය ගැමි සමාජයේ ලක්ෂණයකි. රංකිරාගේ ජීවන විපර්යාසය ද හේතුඵල සම්බන්ධතාවෙන් යුතු ව ඉදිරිපත් කෙරේ.

- නිර්මාණශීලී භාෂාව

  නුවර කලාවියේ ගැමියන්ට ආවේණික ප්‍රාදේශීය භාෂා ව්‍යවහාර සහිත සරල ගැමි බස කතුවරයා චරිත හා අවස්ථාවලට උචිත පරිදි යොදා ගනී.

  උදා :- "ඔහුගේ ගෙදර උන්දෑ වන පිංචිමහයියා මේ වෙලාවේ කුස්සි යාලත්තේ සිටියා ය.

  "අනේ මහත්තයෝ මට ඉන්නේ ඔය කොල්ල විතරයි. - හරක් පැටියෙක් දක්කාගෙන යන්ඩ. මං පස්සේ නඟුල් කෙටියක් අරන් එන්ඩ..."

- උචිත පරිසර වර්ණනා

  උදා : "අනූනව අවුරුද්දට ලැබුණු ගෙවත්ත සම්පූර්ණයෙන් ම වල්බිහි වී ඇත... වෙනදා ඒ පැත්තෙන් දෙනුන්ගේ හඬ රෑ දහවල් ඇසෙයි...."

- සංකේත භාවිතය

  උදා :- "ඈ තවත් මොහොතක් බලා සිට හුල්ලා නැඟී සිටියා ය... හිරමනයේ හිඳගෙන නිවී ගිය ළිප දෙස බලාගෙන සිටියාය."

- සාර්ථක අවස්ථා නිරූපණ

  උදා : "මහලු රංකිරා උන්දෑ වානේ කඩේ ඉස්සරහා නතර විය.... අනේ මුදලාලි උන්නැහේ අරක ටිකක් දාන්ඩ. මගේ හීං කොල්ලගෙ කටහඬ ටිකක් අහන්ඩ."

- ජීවන දෘෂ්ටිය

  මාපිය-දූදරු සම්බන්ධතාව දරුවන් අතින් ගිලිහී ගිය ද එය දෙමාපියන් අතින් කිසි දා ගිලිහී නොයන බව මින් ධ්වනිත කෙරේ.

**කපිතන්ගේ පුත්තු** - සිය රාජකාරිය හා බැඳුණු වගකීම් ද ජීවිතය හා සබැඳි සංවේදී අද්දැකීම් ද අතරෙහි ගැටෙන පුද්ගලයකුගේ චෛතසික ස්වරූපය සියුම් ලෙසට අනාවරණය කරන්නට දැරූ තැතක් මෙම කෙටිකතාවෙන් නිරූපිත ය. දරිද්‍රතාවෙන් වෙළී ගිය, තරුණ නැඟී සිටීම් සිදුවන පසුබිමක කෙටිකතා රචකයා ප්‍රමුඛත්වයක් දී ඇත්තේ කපිතන්ගේ චරිතයට යි.

- චරිතාංග නිරූපණය - හමුදා නිලධාරියකු වූ කපිතාන්ගේ මානුෂීය ගුණාංග මේ කෙටිකතාවෙන් අපූර්ව ලෙස විවරණය කෙරේ.
  උදා : "ඒ සැණින් ම බූට් සපත්තුවකින් කොලුවාගේ හිස එසවී පසෙකට හැරුණි. එම උදව්ව කළ සෙබලා කපා බිම හෙළීමට සේ රවා බැලූ කපිතාන් තැන...."
  "කාකි පැහැති බිහිසුණු දඬු අඬුවට කෙමෙන් තද වන වතුරාන තුළ අන් කිසිවකු නොරඳන ලෙස ඔහු සිතින් දෙවියන් යැදී ය."

- නිර්මාණශීලී භාෂාව
  සංක්ෂිප්ත, ධ්වනිතාර්ථවත් මෙන් ම රූපකාර්ථවත් භාෂාවක් මේ කෙටිකතාව පුරා දක්නට ඇත.
  උදා : "නාකඳ...නාකඳ...නාකඳ? කටුක අව්වට තෙත සිඳී ගල් පොත්තට ම ඇලී අතුරුදන් වූ මී මල් පොද වැස්සට පෙඟී මතු වූ පරිදි කාලයෙන් වියැළී ගිය ඔහුගේ ළමාවියේ යම් යම් සිද්ධීන් යළි බිහිවීමට වෙර දරයි."
- කථා වින්‍යාසය
  කපිතාන්ගේ අතීත මතක සටහන් හා වර්තමාන සිදුවීම් මනා ලෙස එකිනෙක හා මුසු කරමින් හේතුඵල සම්බන්ධතාව අනුව කතාව විකාසනය කෙරේ.
- ජීවන දෘෂ්ටිය
  මානව දයාව මෙහි කැපී පෙනෙන දෘෂ්ටිය යි.

**දිසොන්චිනා හාමි** - එකිනෙකට වෙනස් සමාජ ස්තර තුනක් නියෝජනය කරන චරිත මෙහි දී අපට හමු වේ. ඒ දොස්තර ජයවර්ධන, බන්දුසේන හා දිසොන්චිහාමි යි. මෙහි දී ඉහළ සමාජ තලයට අයත් ඇතැම් පුද්ගලයන් හා පොදු ජනයාගේ ජීවන අපේක්ෂාවල පරස්පරතා මැනවින් ධ්වනිත කෙරේ.

- චරිතාංග නිරූපණය
  මවුබිමට පැමිණෙන දොස්තර ජයවර්ධනගේ අපේක්ෂා භංගත්වය, බන්ධුසේනගේ පන්ති විරහිත සමාජයක් පිළිබඳ අපේක්ෂා මෙන් ම දිසොන්චිනාහාමිගේ ගැමි සාරධර්ම ද කතුවරයා විශ්වසනීයත්වයකින් ඉදිරිපත් කරයි. සමකාලීන ලාංකික සමාජ ක්‍රමය පිළිබඳ මනා විවරණයක් ද මෙහි අන්තර්ගත වේ.
  නිර්මාණශීලි භාෂාව
  වෘත්තීන්ට, සමාජ මට්ටමට හා චරිත ලක්ෂණවලට අදාළ ලෙස නිර්මාණශීලී භාෂාවක් යොදා ගෙන තිබේ.

  උදා : "එක ලෙඩෙක් මැරුණාට වෛද්‍ය විද්‍යාව මැරෙන්නේ නැහැ නේ... අපේ වගකීම ලෙඩ්ඩුන්ට වගේ ම විද්‍යාවටත්."
  "මොන විශ්වාසයක් ද සර් ඒ දුප්පත් හිඟන්නන්ට"
- දෘෂ්ටිකෝණය - ප්‍රථම පුරුෂ දෘෂ්ටිකෝණය.
- ජීවන දෘෂ්ටිය
  සමකාලීන සමාජ-ආර්ථික හා දේශපාලන ව්‍යුහය පිළිබඳ විවේචනාත්මක දෘෂ්ටියක් හෙළන කතුවරයාගේ මානව දයාව මින් ප්‍රකට වෙයි.
  පිළිතුරු සඳහා යොදා ගත් අනෙකුත් කෙටිකතාවලින් ද මේ ආකාරයෙන් කරුණු සාකච්ඡා කිරීම අපේක්ෂා කෙරේ.

**7.** උපයුක්ත භාෂාව හා වස්තුවිෂය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් කොළඹ කවියේ ප්‍රථම තරංගයට/අවධියට අයත් කවීන් විසින් රචිත ළමා කාව්‍ය නිර්මාණවල දිස් වන විශේෂතා පැහැදිලි කරන්න. (ලකුණු 15 යි.)

සිංහල පද්‍ය සාහිත්‍යයෙහි සංක්‍රමණීය අවස්ථාවක් නියෝජනය කරන කොළඹ කවියෙහි ප්‍රථම තරංගයට / අවධියට අයත් කවීන්ගේ ළමා කාව්‍ය නිර්මාණවල පෙනෙන විශේෂතා අතුරින් සරල සුගම භාෂා භාවිතය පිළිබඳ අවධානය යොමු විය යුතු ය. එබඳු භාෂාවිලාසයක් සිංහල කවි සම්ප්‍රදායෙහි ප්‍රථම වතාවට දැක ගත හැකි වන්නේ කොළඹ කවීන්ගේ ළමා කාව්‍ය නිර්මාණාවලියෙහි පමණි. "දිලිහි දිලිහි ආකාසේ බබලන මල් තාරකා - බැබලි බැලලි ආකාසේ දිලිසෙන මල් තාරකා" වැනි කාව්‍යමය ව්‍යවහාර ඊට නිදසුන් ය.

එම කවීන්ගේ පොදු වස්තු විෂය, ජාත්‍යනුරාගය, බුදු ගුණ, සොබා සිරිය, අතීතය පිළිබඳ අභිමානය වැනි තේමාවලින් යුක්ත වුව ද ළමා කාව්‍ය නිර්මාණවල වස්තු විෂයයෙහි පෙනෙන විශේෂත්වයක් වන්නේ සොබාදහමේ සුන්දරත්වය, ළමා ලොවේ කෙළි ලොල් සිතුම්-පැතුම්, යහපත් සිරිත්-විරිත් හා පැවතුම් ආදි එතෙක් සිංහල කවියට විෂය නො වූ කලාපයක් විෂය කර ගැනීම යි.

මේ පිළිතුර සඳහා නිර්දිෂ්ට කාව්‍ය සංග්‍රහයෙහි එන 'සමනලයා' මැයෙන් වූ නිර්මාණය පමණක් නිදසුන් ලෙස දක්වා ඇතත් නිසි ලකුණු ප්‍රදානය කළ යුතු ය. ඊට අතිරේක ව ශිෂ්‍යයා/ශිෂ්‍යාව කොළඹ කවින්ගේ ප්‍රථම තරංගයට/ අවධියට අයත් කවීන්ගේ සෙසු නිර්මාණවලින් නිදසුන් සපයා ඇත්නම් ඊට ලකුණු ප්‍රදානය කළ යුතු ය. එසේ ම කුමාරතුංග මුනිදාසගේ ළමා කාව්‍ය නිර්මාණවලින් නිදසුන් සපයා ඇත්නම් එය ද බැහැර නො කළ යුතු ය.

**8.** "නාට්‍යෝචිත අවස්ථා මතු කිරීමත් එමගින් සංකීර්ණ මානව චිත්තාවේග නිරූපණය කිරීමත් හේතු කොට ගෙන 'පෙමතො ජායතී සොකො' නාට්‍යය සහෘදයාගේ සිත් දිනා ගනී." විමර්ශනය කරන්න. (ලකුණු 15 යි.)

'පෙමතො ජායතී සොකො' නාට්‍යය සහෘදයාගේ සිත් ගන්නේ නාට්‍යෝචිත අවස්ථා මතු කිරීම හා එමගින් සංකීර්ණ මානව චිත්තාවේග නිරූපණය කිරීම හේතුවෙනි යන්න කරුණු විමර්ශනය කිරීම මේ පිළිතුරෙන් අපේක්ෂා කෙරේ.

නාට්‍යෝචිත අවස්ථාවක් යනුවෙන් අදහස් වන්නේ ප්‍රතිවිරුද්ධ චරිත අතරෙහි ගැටුම් ඇති වන අවස්ථාවක් හෝ එක ම චරිතයක් තුළ වුව ද අභ්‍යන්තර ගැටුමක් නිරූපණය වන අවස්ථාවක් හෝ ප්‍රේක්ෂකයාගේ දැඩි කුතූහලයට, ආතතියට ඉවහල් වන ඕනෑ ම උද්වේගකර අවස්ථාවක් ය. පුද්ගලයාගේ චිත්තාවේගවල සංකීර්ණතා දැක ගත හැකි වන්නේ ද එබඳු අවස්ථාවල ය. එබැවින් එවැනි අවස්ථා විමසා බැලීමට යොදා ගත හැකි නිදසුන් කිහිපයක් මෙසේ දැක්විය හැකි ය.

- නාට්‍යය ආරම්භ වීමත් සමඟ ම උද්දාල බමුණා කැලඹුණු මනසින් යුතු ව වේදිකාවට පැමිණෙන අවස්ථා ව,

උදා : "පිය සිසුනි සිදු වූයෙ
විපතක් මට මහත්-
නොදැනේය පුවත් කිසි,
සිත මාගෙ වියවුල්ය."

- ඔහුගේ ශිෂ්‍යයන්ට මෙන් ම ප්‍රේක්ෂකයන්ට ද මේ අවස්ථාව මහත් කුතූහලයක් දනවන්නකි. එසේ ම උද්දාල බමුණාගේ චිත්තාවේගවල ස්වරූපය ඔහුගේ වචනවලින් ද විලාසයෙන් ද ප්‍රේක්ෂකයාට පැහැදිලි වේ.

උදා : "මුළු ගත වෙවුලයි දහඩිය වැගිරේ..."
"හිඳ ගත නොහැකිය මා ප්‍රිය දප්පුල
එකලස් කර ගන්නා තුරු මා සිත."

- සිප්සල අසලට එන ස්වර්ණතිලකා හා ඇගේ පියා පලවා හරින්නට ශිෂ්‍යයන් උත්සාහ දරන අවස්ථාව.

  උදා : "මෙතනට එන්නට අප ඇදුරිඳු සඳ
  නැත කිසි කෙනෙකුට අවසර දීලා"
  "ගැහැනු මෙහි නොපිවිසෙති
  රුචි නොවේ ඇදුරිඳුට
  මාගමුන් සහවාසෙ."

- ශිෂ්‍යයන්ගේ විරෝධතාව මගින් ප්‍රකාශ කෙරෙන්නේ ඔවුන්ගේ සිත් තුළ ඇති සාම්ප්‍රදායික ආකල්පය යි. මෙතෙක් කාලයක් ඇදුරුතුමා ස්ත්‍රිය පිළිබඳ සිය ශිෂ්‍යයන් තුළ ඇති කළ ස්ථාවරයේ ප්‍රතිඵලය එයයි.

- ශිෂ්‍යයන්ගේ විරෝධතාව හමුවේ අසරණ ව එතැනින් බැහැර වීමට සැරසෙන ස්වර්ණතිලකා හා ඇයගේ පියා උද්දාල බමුණාගේ දර්ශනයට හසු නො වෙති'යි යන කැලඹීම ප්‍රේක්ෂකයා තුළ මේ වෙලාවෙහි ඇති වෙයි.

- පංචමධුරාපුරයේ දී ස්වර්ණතිලකා හා ඇගේ පියාගේ පැවැත්ම ස්ථාවර වුව ද උද්දාල බමුණාගේ සිත අස්ථාවරත්වයට පත් වීම හේතුවෙන් ඔහු කරන ප්‍රකාශ නාට්‍යෝචිත අවස්ථාවක් ගොඩ නගයි. එහි දී නිරූපණය වන්නේ ඔහුගේ අභ්‍යන්තර ගැටුම යි.

  උදා : "පිළිසරණ වනු මෙමට..
  සතර දිග වේ අඳුරු.
  පසිඳුරන් දොරටු රැකි මුර පිරිස්
  පරාද වී පලා ගියෝ"

  මෙයින් උද්දාල බමුණාගේ සිත් තැවුල සන්සිඳේ ද යන පැනය ප්‍රේක්ෂකයා හට ඇති වේ. ස්වර්ණතිලකා ඔහුගේ ඉල්ලීමට එකඟ නොවීම මගින් එම උද්වේගකර ස්වභාවය තවදුරටත් ඉදිරියට ඇදී යයි.

- ස්වර්ණතිලකා මැරවීමට සිසුන් උපායන් යෙදීම හා ඇය ගෙයින් පිටතට රැගෙන යාමට උත්සාහ ගන්නා අවස්ථාව.
  මෙහි දී ස්වර්ණතිලකා කෙරෙහි සිසුන් තුළ ඇති නොමනාපය හා තම ආචාර්යවරයා ඇගෙන් ගලවා ගැනීමේ අභිලාෂය ද වංචාවෙන් සිය අරමුණු ඉටු කර ගැනීමේ දැඩි මානසිකත්වය ද අපට පැහැදිලි වේ.

  උදා : "පැහැර ගත යුතුය ළඳ
  ඇදුරිඳුගෙ සමීපයෙන්
  ගොස් බාර දිය යුතුය
  ඇය ගෙනා ඇගේ පියා වෙතට යළි"

  " මොළ ඇතා වුව දනී
  ගුරුතුමාහට සෙනේ

ඇති එකම ළඳයි මේ.

හිංසාවක් නොකරයි ඌ.''

එසේ ම මෙම අවස්ථාවේ දී ස්වර්ණතිලකා තුළ ඇති වන බිය, සැක, අසරණභාවය ආදි චිත්තාවේග ඇගේ ප්‍රකාශන මගින් ඉස්මතු වේ.

උදා : ''යා නොහැකිය

බියකුත් ඇත මා සිත තුළ

කුතූහලය මැඩගෙන එන.''

මෙවැනි නාට්‍යෝචිත අවස්ථා හා එමගින් නිරූපණය වන සංකීර්ණ මානව චිත්තාවේග පිළිබඳ ව පිළිතුරෙහි අවධානය යොමු විය යුතු ය.

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2019 (නව නිර්දේශය)

## 71 - සිංහල II

ලකුණු බෙදීයාම

### II පත්‍රය

I කොටස (පළමු ප්‍රශ්නය) : මෙම ප්‍රශ්නය වරණ 05 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 20කින් සමන්විත ය. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය. මෙහි එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් ලකුණු 20කි.)

II කොටස : මෙම කොටස ප්‍රශ්න 07කින් සමන්විත වේ. දෙවන හා තෙවන ප්‍රශ්න අනිවාර්ය වන අතර සම්පූර්ණ 04කට පිළිතුරු සැපයිය යුතු ය.

| | | | | |
|---|---|---|---|---|
| 02 ප්‍රශ්නය | : | අවබෝධය | - | ලකුණු 12 (02 x 6 = 12) |
| | | සාරාංශය | - | ලකුණු 13 (02 + 03 + 08 = 13) |
| 03 ප්‍රශ්නය | : | රචනය | - | ලකුණු 25 |
| 04 වන ප්‍රශ්නයේ සිට 08 වන ප්‍රශ්නය තෙක් පිළිතුරු සඳහා | | | - | ලකුණු 15 |

**(II වන පත්‍රය සඳහා මුළු ලකුණු 20 + 25 + 25 + 15 + 15 = 100)**

| | |
|---|---|
| අවසාන ලකුණු ගණනය කිරීම I පත්‍රය | = 100 |
| II පත්‍රය | = 100 |
| **අවසාන ලකුණු** | **= 200 ÷ 2 = <u>100</u>** |

## අභිමතාර්ථ

II පත්‍රය - I කොටස

සිංහල අක්ෂර මාලාව, ඊට අයත් විවිධ ප්‍රභේද, පද සංයෝජනය, උක්තාඛ්‍යාත රීති හා භාෂාවේ ප්‍රමුඛ ව්‍යාකරණාංග පිළිබඳ විභාග අපේක්ෂකයන් සතු අවබෝධය විමර්ශනය කිරීම මින් අපේක්ෂිත ය.

II පත්‍රය - II කොටස

අපේක්ෂකයන් සතු සංශ්ලේෂණ හා විශ්ලේෂණ ශක්‍යතාව ද විචාරශීලී චින්තනය, නිර්මාණාත්මක කුසලතා මෙන් ම අනිර්දිෂ්ට ගද්‍ය පාඨවල අර්ථාවබෝධය මැන බැලීම ද වාක්‍ය රීති, ප්‍රමුඛ ව්‍යාකරණාංග හා ශෛලීපීය ලක්ෂණ පිළිබඳ කුසලතා විමර්ශනය කිරීම ද මේ කොටසින් අපේක්ෂිත ය.

AL/2019/71/S-II(NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

සිංහල II
சிங்களம் II
Sinhala II

71 S II

2019.08.15 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

විභාග අංකය : ..........................

**උපදෙස්:**

* **I** කොටසේ **1** ප්‍රශ්නය ද, **II** කොටසේ **2, 3** ප්‍රශ්න ද, ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* **1** ප්‍රශ්නයේ ඇති **සියලු ම** අනුකොටස්වලට මෙම **ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
* **I** කොටස, **II** කොටසේ පිළිතුරු පත් සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

**1.** එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරා ගෙන, **එයට හිමි අංකය වරහන තුළ ලියන්න.**

1.1. සිංහල වර්ණ මාලාවෙහි එන 'ඕ' යන්න කුමන අක්ෂරයක් ද?
(1) කණ්ඨ තාලුජ (2) දන්තෞෂ්ඨජ (3) කණ්ඨජ
(4) කණ්ඨෞෂ්ඨජ (5) තාලුජ (……)

1.2. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.
(1) කන්කලු, වළාකුළු, දෘෂ්ඨිකෝණය, නිර්මාංස, නිස්සබ්ධ
(2) කන්කළු, වළාකුලු, දෘශ්ටිකෝණය, නිර්මාංෂ, නිශ්ශබ්ධ
(3) කන්කලු, වලාකුලු, දෘස්ඨිකෝණය, නිර්මාංශ, නිෂ්ශබ්ද
(4) කන්කළු, වලාකුළු, දෘෂ්ටිකෝනය, නිර්මාංස, නිශ්ශබ්ද
(5) කන්කලු, වලාකුළු, දෘෂ්ටිකෝණය, නිර්මාංශ, නිශ්ශබ්ද (……)

1.3. අකාරාදි පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති පද පේළිය තෝරන්න.
(1) පතෝල, වම්බටු, නිවිති, තම්පලා (2) කරවිල, පිපිඤ්ඤා, බෝංචි, මැකරල්
(3) වට්ටක්කා, පුහුල්, දඹල, ගොටුකොළ (4) කතුරුමුරුංගා, කොහිල, තුඹ, තිබ්බටු
(5) කොස් ඇට, කංකුන්, කැරට්, මුකුණුවැන්න (……)

1.4. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිරවද්‍ය ප්‍රකාශය තෝරන්න.
(1) වචනයක ආරම්භක අක්ෂරය සේ විසර්ගය යෙදේ.
(2) විසර්ගය ස්වරයකට පසු ව පමණක් යෙදේ.
(3) විසර්ගය ලිවීමේ දී 'ඃ' ට පූර්වයෙන් 'අ' යන්න යෙදී තිබීම අනිවාර්ය ය.
(4) විසර්ගය ව්‍යඤ්ජනයකට පසු ව පමණක් යෙදේ.
(5) අනුස්වාරය හා විසර්ගය සැම විට ම වචනයක එක සමීපයෙහි යෙදේ. (……)

1.5. එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.
(1) විදුලිය ආලෝකය, භාණ්ඩ සමීක්ෂණය, සංවාද මණ්ඩපය, සම්මන්ත්‍රණ ශාලාව
(2) අයවැය විවාදය, දේශීය ආර්ථිකය, අවුරුදු උලෙළ, වාසනා මන්දිරය
(3) ප්‍රජා අයිතිය, මූල්‍ය කළමනාකරණය, පාරිභෝගික අධිකාරිය, සංවර්ධන ඉලක්ක
(4) දුම් පරීක්ෂණය, පතාල ලෝකය, උයන් කෙළිය, පරිසර විනාශය
(5) සමාජ අසාධාරණය, මූලධර්ම වාදය, ත්‍රිපිටක අභිවන්දනය, දේශපාලන විචාරකයා (……)

1.6. තත්සම පද පමණක් යෙදී ඇති වරණය කුමක් ද?
(1) ආභරණ, දෙරණ, උපකරණ, වාරණ (2) ශාලා, ජාලා, ලූලා, මාලා
(3) නිර්ධන, නිර්ගුණ, නිර්මල, නිර්මාණ (4) සකල, සුලකළ, විකල, අකාල
(5) සුමධුර, සුධවල, සුසංවර, සුපෙම්බර (......)

1.7. තද්භව වචන පමණක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) සසර, මිතුර, කතර, උත්තර (2) පියන, රියන, නයන, වියන
(3) පුත්, නෙත්, පත්, ගත් (4) මව, නැව, හව, පව
(5) සුදු, බුදු, මෘදු, කුදු (......)

1.8. 'යවි, කු, ප, න' යන වර්ගයන්ට අයත් අව්‍යය සමාස පද පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.
(1) සුසැදි, කුමන්ත්‍රණ, අනියම්, අනුමෝදනා (2) අනියම්, කුමන්ත්‍රණ, සුසැදි, අනුමෝදනා
(3) අනුමෝදනා, සුසැදි, අනියම්, කුමන්ත්‍රණ (4) සුසැදි, අනුමෝදනා, කුමන්ත්‍රණ, අනියම්
(5) අනුමෝදනා, කුමන්ත්‍රණ, සුසැදි, අනියම් (......)

1.9. කෘදන්තයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) සරන, දරණ, කරන, වරන (2) සිතු, ගෙතු, පැතු, එතු
(3) සැරෙන, පැරෙන, තේරෙන, වැමැරෙන (4) ඛාදන, වාදන, ඡේදන, වේදන
(5) පැළිලි, බැලිලි, හැළිලි, දිලිලි (......)

1.10. පහත සඳහන් උද්ධෘතවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.
(අ) "**දමාලා** යන නරක කුණු කය ..."
(ආ) "**වයව** තත් සිඳ සිඳ"
(ඉ) "එදා සහසකර පහනෙව් **කරත** හෙළි"
(ඊ) "අව්වේ තියෙන රුස්මාලා අඩු **වේවා**!"
(1) අසම්භාව්‍යක්‍රියා, විධික්‍රියා, පූර්වක්‍රියා, ආශීර්වාදක්‍රියා
(2) පූර්වක්‍රියා, විධික්‍රියා, අසම්භාව්‍යක්‍රියා, ආශීර්වාදක්‍රියා
(3) විධික්‍රියා, අසම්භාව්‍යක්‍රියා, ආශීර්වාදක්‍රියා, පූර්වක්‍රියා
(4) පූර්වක්‍රියා, අසම්භාව්‍යක්‍රියා, විධික්‍රියා, ආශීර්වාදක්‍රියා
(5) විධික්‍රියා, පූර්වක්‍රියා, අසම්භාව්‍යක්‍රියා, ආශීර්වාදක්‍රියා (......)

1.11. තද්ධිතයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) දාරුමය, රජතමය, පිළිමය, වජ්‍රමය (2) අද්‍යතන, නූතන, සදාතන, මධ්‍යතන
(3) මාධූර්ය, සාමර්ථ්‍ය, ධෛර්ය, සාකල්‍ය (4) ගුණවත්, ධනවත්, බලවත්, නැණවත්
(5) මිත්තණි, දියණි, මැණි, නැන්දණි (......)

1.12. උපසර්ගයක් **යෙදී නැති** පදයක් සහිත පද පේළිය තෝරන්න.
(1) දුෂ්කර, දුශ්ශීල, දුෂ්පෝෂණ, දුස්සාධ්‍ය (2) නිදොස්, නිවහල්, නිතරග, නිකැලැල්
(3) පබල, පමොද, පබඳ, පබොද (4) නිරවශේෂ, නිරාගමික, නිරාමිෂ, නිරපේක්ෂ
(5) සුලලිත, සුරිඳු, සුමිතුරු, සුචරිත (......)

1.13. නිපාතයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) අන්න, මෙන්න, අතන, මෙතන (2) කල්හි, සඳ, පටන්, තෙක්
(3) සඳහා, වෙනුවෙන්, පිණිස, විනිස (4) සේ, එව්, බඳු, වැනි
(5) හෙවත්, නොහොත්, වනාහි, චූකලි (......)

1.14. "මගී ජනතාවගේ **ගමනාගමන** කටයුතු **ප්‍රවර්ධනයට** නිලධාරීහු **විධිමත්** පියවර ගනිති" යන වාක්‍යයෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව **තද කළු අකුරෙන්** ඇති පද අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංගවලට ද?
(1) සන්ධි, උපසර්ග හා තද්ධිත (2) උපසර්ග, සන්ධි හා තද්ධිත
(3) සන්ධි, තද්ධිත හා උපසර්ග (4) තද්ධිත, උපසර්ග හා සන්ධි
(5) උපසර්ග, තද්ධිත හා සන්ධි (......)

1.15. සමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය කරන ක්‍රියා රූප සහිත වරණය තෝරන්න.
(1) සැරසුවා ය, මතුළා ය, වැනසුවේ ය, ඇඹරුවා ය
(2) නටද්දී, කියද්දී, මුමුණද්දී, ඇමුවොත්
(3) සරසනුව, ලියනුව, පමුණුව, තබනුව
(4) තළවයි, සෘදවයි, බලවයි, පාගවයි
(5) කළේ ය, බැලුවේ ය, දැම්මා ය, දුන්නේ ය (......)

1.16. සමාසයක් **නොවන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) අහසපොළොව, ධනධාන්‍ය, වැව්මුහුද, පිඟන්කෝප්ප
(2) අනුචිත, අනාගත, අනපේක්ෂිත, අනුල්ලංඝනීය
(3) විනිසකරු, ගොපල්ලා, කම්කරු, අතවැසි
(4) දුදන, දුසිරිත්, දුබල, දුලබ
(5) ඇත්ගාල, රජඅණ, ළමාලොව, සර්පවිෂ

1.17. එක ම වර්ගයට අයත් සන්ධි පද අන්තර්ගත වරණය තෝරන්න.
(1) පොල්ලත්ත, පත්තිරු, ගොක්කොළ, නිල්ලහස
(2) විවේකාගාරය, ජලාපවහන, රූපකාලංකාරය, ජාතිකෝත්සවය
(3) පුරඟන, නරඟන, දෙවඟන, ගවඟන
(4) නරනිඳු, බමරිඳු, කෙසරිඳු, තෙරිඳු
(5) දැස, දැවර, දැළ, දැඟිලි

1.18. ව්‍යාකරණානුකූල ව **නොගැළපෙන** පදයක් ඇති වරණය කුමක් ද?
(1) පෙම්ගඟුල, හදවිමන, කිතුගොස, සෝගින්න
(2) පූජෝත්සව, මහෝපාධ්‍යාය, අවස්ථෝචිත, මහෝත්තම
(3) අධිකතර, පාපතර, යෝග්‍යතර, ජ්‍යෙෂ්ඨතර
(4) නියත, කියත, විරිත, සිරිත
(5) පෑ, දෑ, නෑ, කෑ

1.19. ව්‍යාකරණානුකූල ව නිවැරදි වැකිය තෝරන්න.
(1) කේයස් නොහොත් සාගර පලන්සූරිය සුදෝසුදු කාව්‍යය රචනා කළේ ය.
(2) රාජ්‍ය නායකයන් රටක ආදර්ශවත් ව හැසිරිය යුත්තාහ.
(3) විශ්වවිද්‍යාලය ශිෂ්‍යයෝ බොහෝ විට විශ්වවිද්‍යාලයේ නැත.
(4) මානව හිමිකම් සම්බන්ධ නීතිහු කලින් කල වෙනස් වෙයි.
(5) ජනාධිපතිතුමා විසින් විද්වතකු රාජ්‍ය සම්මානයෙන් පුදන ලදි.

1.20. ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍යය සහිත වරණය තෝරන්න.
(1) දැන් ඒ ගොල්ලො සමාගමේ ලොක්කො වෙලා ද?
(2) අනුන්ට දොස් නො කියා තම රාජකාරිය ඉටු කිරීම මැනවි.
(3) දඹුල්ල පැත්තේ මං පහරන්නො කට්ටියක් ඉන්නව ලු.
(4) ඒ ළමයා උදේ හිටන් අව්වෙ වැඩ කොරන්නෙ.
(5) කිව්වත් වාලෙ උන්දැ ගෙදරට ම ඇවිල්ල නොවැ.

**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

**අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2019**

**නව නිර්දේශය/ புதிய பாடத்திட்டம**

**II පත්‍රය**

**විෂය අංකය / பாட இலக்கம்:** 71

**විෂයය / பாடம்:** සිංහල

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

## I කොටස

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|
| 01. | 4 | 11. | 1 |
| 02. | 5 | 12. | 5 |
| 03. | 2 | 13. | 3 |
| 04. | 2 | 14. | 1 |
| 05. | 5 | 15. | 4 |
| 06. | 3 | 16. | 1 |
| 07. | 3 | 17. | 5 |
| 08. | 5 | 18. | 4 |
| 09. | 1 | 19. | 3 |
| 10. | 2 | 20. | 2 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 01 ලකුණු බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 1 × 20 = 20

## II කොටස

- මෙම කොටසින් **2, 3** ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

**2.** (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ලෝකයේ බොහෝ රටවල් මෙන් ම ශ්‍රී ලංකාව ද වැඩිහිටි ජනගහන ප්‍රතිශතය ඉහළ යාමේ සමාජ අර්බුදයට මුහුණ දෙමින් සිටී. මෙම වැඩිහිටියන්ට රැකවරණය සැලසීම සම්බන්ධයෙන් වර්තමානයේ ප්‍රබල සමාජ මතයක් ගොඩනැගෙමින් පවතී. බටහිර රටවලටත් ඇතැම් පෙරදිග රටවලටත් වඩා ශ්‍රී ලාංකේය පවුල හා ප්‍රජාව තුළ වැඩිහිටියන් රැකබලා ගැනීමට අදාළ ව ක්‍රියාත්මක වූ ප්‍රජාපාදක ආරක්ෂිත ජාලයක් පැවති බව සාම්ප්‍රදායික සමාජ රටාව පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වේ. වර්තමානයේ පවා බොහෝ වැඩිහිටියන් තම දරුමුණුබුරන් හෝ ඥාතීන් සමග ජීවත් වීමට වැඩි කැමැත්තක් දක්වන බව සමාජ පර්යේෂකයෝ පවසති. සාඵල්‍යතාව අඩුවීම නිසා දරුවන්ගේ ප්‍රමාණය පහළ යාම, දේශීය හා විදේශීය සංක්‍රමණ, නාගරීකරණය හා කාන්තාවන් රැකියාවල නිරත වීම ආදි සාධකවල සෘජු බලපෑම නිසා පවුල කේන්ද්‍රීය ව ක්‍රියාත්මක වූ වැඩිහිටියන් රැකබලා ගැනීමේ ක්‍රියාවලිය වර්තමානයේ අභියෝගයකට ලක් වෙමින් පවතී. බොහෝ පර්යේෂකයන් පෙන්වා දෙන පරිදි ශ්‍රී ලාංකේය ජන සමාජයෙහි සිදුවන ප්‍රජාවිද්‍යාත්මක හා සමාජ, ආර්ථික වෙනස්කම් හේතුවෙන් හටගැනෙන පවුල් විසංවිධානය නිසා වියපත් වූවන්ගේ රැකවරණය සඳහා පවුල තුළ සක්‍රිය වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වීමට බාධා මතු වේ. දිවා සුරැකුම් මධ්‍යස්ථාන හා තදනුබද්ධ ධනාත්මක ලක්ෂණ, යටිතල පහසුකම් හා අවශේෂ සේවාවන් ප්‍රවර්ධනය කිරීමටත් කළමනාකරණ ක්‍රියාවලිය වඩාත් විධිමත් කිරීමටත් කාර්ය මණ්ඩලයට නිසි පුහුණුවක් ලබා දීමටත් අවශ්‍ය කටයුතු සම්පාදනය වුවහොත් මෙරට සංස්කෘතියට හා සමාජ ව්‍යුහයට ගැළපෙන ආකෘතියක් ගොඩනගා ගැනීමට හැකියාවක් ලැබෙනු ඇත. වියපත් වූවන් හැකිතාක් දුරට රටේ සමස්ත සංවර්ධන ක්‍රියාවලියේ කොටස්කරුවන් බවට පත් කර ගැනීමට ප්‍රතිපත්ති සැකසීම ඔවුන්ගේ කායික හා මානසික සෞඛ්‍යය යහපත් වීමටත් රටේ සංවර්ධන ක්‍රියාවලිය වඩාත් ශක්තිමත් වීමටත් බලපානු ඇත.

(i) සාම්ප්‍රදායික ශ්‍රී ලාංකේය සමාජයේ වැඩිහිටියන් රැකබලා ගැනීම උදෙසා ක්‍රියාත්මක වූ වැඩපිළිවෙළ ලේඛකයා හඳුන්වන්නේ කවර නමකින් ද?

(ii) වැඩිහිටියන් රැකබලා ගැනීම සඳහා අතීතයේ පැවති ක්‍රියාවලිය වර්තමානයේ අභියෝගයකට ලක් ව ඇත්තේ කවර කරුණු හේතුවෙන් ද?

(iii) වියපත් වූවන්ගේ කායික හා මානසික සෞඛ්‍යය යහපත් කිරීම උදෙසා ලේඛකයා යෝජනා කරන්නේ කුමක් ද?

(iv) මෙම පාඨයෙහි සඳහන් වන ආකාරයට මෙරට සංස්කෘතියට හා සමාජ ව්‍යුහයට ගැළපෙන ආකෘතියක් ගොඩනගා ගැනීමට සම්පාදනය විය යුතු අවශ්‍යතා මොනවා ද?

(v) වියපත් වූවන්ගේ රැකවරණය සඳහා පවුල තුළ සක්‍රිය වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වීමට බාධාව වශයෙන් සමාජ පර්යේෂකයන් දක්වන්නේ කුමක් ද?

(vi) මෙහි දැක්වෙන පරිදි ලෝකයේ බොහෝ රටවල් හා ශ්‍රී ලංකාව මුහුණ පාන්නේ කෙබඳු සමාජ අර්බුදයකට ද?

(ලකුණු 12 යි.)

(අ) සඳහා පිළිතුරු

i. ප්‍රජාපාදක ආරක්ෂිත ජාලය යන නාමයෙන්

ii. 1. සාඵල්‍යතාව අඩු වීම නිසා දරුවන්ගේ ප්‍රමාණය පහළ යාම
    2. දේශීය හා විදේශීය සංක්‍රමණ
    3. නාගරීකරණය
    4. කාන්තාවන් රැකියාවල නිරත වීම

**(සම්පූර්ණ පිළිතුරට ලකුණු 02කි. කොටස් 02ක් හෝ 03ක් හෝ ඇත්නම් ලකුණු 01කි. එක් කොටසක් පමණක් ඇත්නම් ලකුණු හිමි නො වේ.)**

iii. වියපත් වූවන් හැකිතාක් දුරට රටේ සමස්ත සංවර්ධන ක්‍රියාවලියේ කොටස්කරුවන් බවට පත් කර ගැනීමට ප්‍රතිපත්ති සැකසීම

iv. 1. දිවා සුරැකුම් මධ්‍යස්ථාන හා තදනුබද්ධ ධනාත්මක ලක්ෂණ
2. යටිතල පහසුකම් හා අවශේෂ සේවාවන් ප්‍රවර්ධනය කිරීම
3. කළමනාකරණ ක්‍රියාවලිය වඩාත් විධිමත් කිරීම
4. කාර්ය මණ්ඩලයට නිසි පුහුණුවක් ලබා දීම

**(සම්පූර්ණ පිළිතුරට ලකුණු 02කි. කොටස් 02ක් හෝ 03ක් හෝ ඇත්නම් ලකුණු 01කි.
එක් කොටසක් පමණක් ඇත්නම් ලකුණු හිමි නො වේ.)**

v. පවුල් විසංවිධානය / ශ්‍රී ලාංකේය ජන සමාජයෙහි සිදුවන ප්‍රජාවිද්‍යාත්මක හා සමාජ, ආර්ථික වෙනස්කම් හේතුවෙන් හටගැනෙන පවුල් විසංවිධානය නිසා

vi. වැඩිහිටි ජනගහන ප්‍රතිශතය ඉහළ යාමේ අර්බුදයට

**(ලකුණු 02 x 6 = 12 යි.)**

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන සේ** සාරාංශ කොට ලියා, සාරාංශය අග, වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

සහභාගිත්ව සංවර්ධනය බිහිවන්නේ දුප්පත් ජනතාවගේ ස්වශක්තිය, සහභාගිත්වය එක්වී බිහි වන නිර්මාණනීය නව උත්පාදන ශක්තිය තුළිනි. එහෙයින් ම මෙම සහභාගිත්ව සංවර්ධන ක්‍රියාවලිය අතිශයින් ම ගැඹුරු වනු පෙනේ. එමෙන් ම අර්ථවත් වනු දිසේ. අනෙක් අතට ජනතා පදනමක් ද එහිලා පැනේ. එමතු ද නොව පවත්නා සාම්ප්‍රදායික සංවර්ධනය වෙනුවට බිහිවන විකල්ප සංවර්ධන ක්‍රියාවලියක් ද වනු ඇත. සහභාගිත්ව සංවර්ධනය බාහිර මූල්‍යාධාර, මහජන ප්‍රයෝජනයට අදාළ විවිධ සහනාධාර හෝ වෙනත් ද්‍රව්‍යමය ආධාර ආදිය අපේක්ෂාවෙන් ආරම්භ කරනු ලබන සංවර්ධන ක්‍රියාදාමයක් නම් නො වේ. සාම්ප්‍රදායික සංවර්ධනයේ දී දිළිඳු ජනතාවගේ නිර්මාණ ශක්තිය මතු වීමට පෙරාතුව ම බාහිර ආධාර ඉස්මතු වෙයි. ඒ සමග ම නැගී එන අංකුර නවෝත්පාදන දහරා වියැකී යයි. නමුත් සහභාගිත්ව සංවර්ධනයේ දී බාහිර ආධාරයන් මත නොව ජනතාවගේ ස්වශක්තිය හා සහභාගිත්වය එක්වීමෙන් බිහිවන නිර්මාණ ශක්තිය සංවර්ධනයේ ඒකායන බලවේගය බවට පත් වෙයි. බාහිර ආධාර සහ සහනාධාර මත පදනම් වූ වැඩසටහන් එම ආධාර ලැබීම් නැවැතීමත් සමග ම ඇණ හිටී. නැතහොත් අතුරුදහන් වනු ඇත. නමුත් සහභාගිත්ව සංවර්ධනයේ දී එසේ නොවන්නේ ජනතාවගේ නිර්මාණාත්මක නවෝත්පාදන ශක්තිය ඒ වන විට වර්ධනය වී සියත් බව තුළ සහභාගිත්වයේ ම රැඳෙන බැවිනි.

(ලකුණු 13 යි.)

(ආ) සාරාංශය (වචන 50 - 60)

- සහභාගිත්ව සංවර්ධනය බිහිවන්නේ දුප්පත් ජනතාවගේ නිර්මාණනීය නව උත්පාදන ශක්තිය තුළින් වන අතර එය අතිශය ගැඹුරු ක්‍රියාවලියකි
- එය පවත්නා සාම්ප්‍රදායික සංවර්ධනය වෙනුවට බිහිවන විකල්පයක් වීම
- මෙය බාහිර මූල්‍යාධාර, මහජන ප්‍රයෝජනයට අදාළ විවිධ සහානාධාර හෝ වෙනත් ද්‍රව්‍යමය ආධාර ආදිය අපේක්ෂාවෙන් ආරම්භ වූ ක්‍රියාදාමයක් නොවීම
- ජනතාවගේ ස්වශක්තිය හා සහභාගිත්වය එක්වීමෙන් බිහිවන නිර්මාණ ශක්තිය සංවර්ධනයේ ඒකායන බලවේගය වීම

- විවිධ ආධාර මත යැපෙන වැඩසටහන්, ඒවා නොලැබීමෙන් නැවතුණත් සහභාගිත්ව සංවර්ධනයේ දී එසේ නො වන්නේ ජනතාවගේ නවෝත්පාදන ශක්තිය වර්ධනය වී සියත් බව තුළ රැඳෙන බැවින් වීම

**ඉහත කරුණු ඇතුළත් ව ලේඛන ව්‍යවහාරයෙන් සාරාංශය ලියා තිබිය යුතු ය. සාරාංශය එක් ඡේදයක් ලෙස දක්වා තිබිය යුතු අතර ඡේදවලට බෙදා ඇත්නම් සමස්තයෙන් ලකුණු 02ක් අඩු වේ. වචන සංඛ්‍යාව 50 - 60 අතර තිබිය යුතු ය. එම ප්‍රමාණය අඩු හෝ වැඩි හෝ වේ නම් ලකුණු 03ක් අඩු වේ.**

| | | |
|---|---|---|
| **සාරාංශයේ නියමිත වචන ප්‍රමාණයට** | - | **ලකුණු 02 යි.** |
| **අක්ෂර වින්‍යාසයට** | - | **ලකුණු 03 යි.** |
| **අන්තර්ගතයට** | - | **ලකුණු 08 යි.** |

**3.** දී ඇති මාතෘකාවලින් **එකකට** අදාළ ව වචන **300 - 350** අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) දේශපාලන අරගල, මැතිවරණ සහ ශ්‍රී ලංකාවේ අනාගත අභියෝග

(ii) ගෝලීය ත්‍රස්තවාදය මැඩපැවැත්වීමට ලෝක බලවතුන් මැදිහත් වීමේ අවශ්‍යතාව

(iii) භාෂාව, සාහිත්‍යය මෙන් ම ඉතිහාසය ද හැදෑරීමට පාසල් ශිෂ්‍යයන් යොමු කරවීමේ කාලෝචිත බව

(iv) ජයග්‍රහණය ම නො ව කායික - මානසික සෞඛ්‍ය වර්ධනය ද ක්‍රීඩාවේ පරමාර්ථවලින් එකකි.

(v) මෙරට පාසල් ශිෂ්‍යයන්ගේ නව නිපැයුම් ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමට යොදා ගැනීමේ යෝග්‍යතාව

(ලකුණු 25 යි.)

**වචන සංඛ්‍යාව 300 - 350 අතර වේ නම් ඉහළ ලකුණු ප්‍රදානය කළ හැකි ය. වචන 400ට වැඩි වේ නම් හෝ 250ට අඩු වේ නම් හෝ ලකුණු 03ක් අඩු කළ යුතු වේ.**

වාක්‍ය රචනයට ලකුණු දීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම සුදුසු ය.

i. රචනය සඳහා තෝරා ගත් මාතෘකාව යටතේ ප්‍රමාණවත් ලෙස කරුණු ඒකරාශීකරණය
ii. එම කරුණු සංවිධානාත්මක ව ඉදිරිපත් කිරීම
iii. කරුණුවල පැහැදිලි බව
iv. නිරවද්‍ය අක්ෂර වින්‍යාසය අනුගමනය කර තිබීම
v. ව්‍යාකරණ දෝෂ රහිත වීම
vi. භාෂාව ව්‍යක්ත ලෙස හැසිරවීම
vii. සුදුසු ලෙස පද බෙදීම හා ඡේද වෙන් කිරීම
viii. කියවිය හැකි සේ අත්අකුරු පැහැදිලි වීම

- විවිධ භාෂාත්මක ප්‍රයෝග භාවිතය (මෙහි දී උපමා, රූපක, ආප්තෝපදේශ, ප්‍රස්තාව පිරුළු වැනි අංග ගැන සැලකිල්ල යොමු කරන්න. එහෙත් ඒ වෙනුවෙන් වෙන වෙන ම ලකුණු දීම අනවශ්‍ය ය. සමස්තයක් වශයෙන් රචනාවෙහි මෙකී අංග සලකා ලකුණු ප්‍රදානය කළ හැකි ය.)

**4.** (අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

(i) මේ කර්මාන්ත ශාලාවෙහි ඉතා දක්ෂ සේවකයන් ඇත.
(ii) අනාථ නිවාස පාලිකාව ඔහු දරුවෙක් මෙන් ඇති දැඩි කළා ය.
(iii) අපි වෙනුවෙන් වැඩ කිරීම සඳහා අපි ම පෙළ ගැසෙමු.
(iv) 'වීරාභිවන්දන' උලෙළේ දී ඇමතිතුමා විසින් ජාතික වීරයෝ ඇගයෙති.
(v) තනතුරු ලෝභයෙන් කටයුතු කරන්නෝ ආත්මාර්ථකාමීන් වෙති.

i. මේ කර්මාන්ත ශාලාවෙහි ඉතා දක්ෂ සේවකයෝ ඇත.
ii. අනාථ නිවාස පාලිකාව ඔහු දරුවකු / දරුවෙකු මෙන් ඇති දැඩි කළා ය.
iii. අප වෙනුවෙන් වැඩ කිරීම සඳහා අපි ම පෙළ ගැසෙමු.
iv. නිවැරදි වැකියකි.
v. තනතුරු ලෝභයෙන් කටයුතු කරන්නෝ ආත්මාර්ථකාමීහු /ආත්මාර්ථකාමියෝ වෙති.

**(ලකුණු 01 x 5 = 05 යි.)**

(ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

(i) ජනාධිපති විදේශ නියෝජිතවරියක පිළිගත්තේ ය.
(ii) සමාජ සේවකයෙක් දුප්පත් ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ට පොත්-පත් බෙදා දෙයි.
(iii) ඔවුහු අධිකරණ නීති-රීතීන් උල්ලංඝනය කරති.
(iv) කවුරු මේ විශාල වෘක්ෂයන් කපා බිම හෙළත් ද?
(v) කුමරතුඟු මුනිදස්හු 'ව්‍යාකරණ විවරණය' ලියූහ.

i. ජනාධිපති විසින් විදේශ නියෝජිතවරියක් පිළිගැනිණි / පිළිගැනුණා ය / පිළිගනු ලැබුවා ය / පිළිගන්නා ලද්දී ය.
ii. සමාජ සේවකයකු විසින් දුප්පත් ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ට පොත්-පත් බෙදා දෙනු ලබයි / ලැබෙයි.
iii. ඔවුන් විසින් අධිකරණ නීති-රීතීහු උල්ලංඝනය කෙරෙති / කෙරෙත් / කරනු ලබත් / ලැබෙත් / ලබති / ලැබෙති.
iv. කවුරුන් විසින් මේ විශාල වෘක්ෂයෝ කපා බිම හෙළෙත් ද? / හෙළනු ලැබෙත් ද? / ලබත් ද?
v. කුමරතුඟු මුනිදසුන් විසින් 'ව්‍යාකරණ විවරණය' ලියැවිණි / ලියැවුණේ ය /ලියනු ලැබිණ / ලැබිණි / ලැබුණේ ය / ලැබුවේ ය / ලැබී ය / ලියන ලද්දේ ය / ලියනා ලද්දේ ය / ලියන ලදි / ලියනා ලදි.

**(ලකුණු 01 x 5 = 05 යි.)**

(ඉ) නිවැරදි වැකියක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පද වරහන් තුළින් තෝරා ලියන්න.

(i) (කෘමීන්/කෘමීහු) කුඹුර විනාශ කරති'යි (ගොවියෙක්/ගොවියකු) දුකින් පසු වෙයි.
(ii) (නිළියක්/නිළියක) වේදිකාවේ නටනවා (ප්‍රේක්ෂකයෝ/ප්‍රේක්ෂකයන්) බලා සිටිති.
(iii) ලංකාවේ රාජ්‍ය නායකයා (හෙවත්/නොහොත්) ජනාධිපතිතුමා ඒ සමුළුවට සහභාගි (වූයේ ය/වූහ).
(iv) (නිවේදකයකු/නිවේදකයෙක්) විසින් ආරාධිත (අමුත්තන්/අමුත්තෝ) පිළිගන්නා ලදහ.
(v) (මැරයන්/මැරයෝ) සාමාන්‍ය ජනතාව බිය ගන්වද්දී වගකිව (යුත්තෝ/යුත්තන්) නිහඬ ව සිටිති.

(ලකුණු 05 × 3 =15 යි.)

i. කෘමීන් - ගොවියෙක්
ii. නිළියක - ප්‍රේක්ෂකයෝ
iii. හෙවත් - වූයේ ය
iv. නිවේදකයකු - අමුත්තෝ
v. මැරයන් - යුත්තෝ

**(ලකුණු 01 x 5 = 05 යි.)**

**5.** පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි අනු අංගය දක්වන්න.

(i) **සඳහිරු** පවත්නා **තුරු** මේ වටිනා වස්තුහු අන්සතු නො **වෙත්වා!** (**සඳහිරු** - සමාස, **තුරු** - නිපාත, **වෙත්වා** - ක්‍රියා)

(ii) **පුරාංගනාවෝ** නුවනත මෙන් ම **වරලස** ද **සුවඳ** ජලයෙන් සේදූහ. (**පුරාංගනා** - සන්ධි, **වරලස** - තද්ධිත, **සුවඳ** - උපසර්ග)

(iii) ජාතික ගීය **ගයද්දී** සියල්ලෝ **ම අසුන්වලින්** නැඟී සිටියහ. (**ගයද්දී**-ක්‍රියා, **ම** - නිපාත, **අසුන්වලින්** - විභක්ති)

(iv) **පෙම්වතා** තම ප්‍රියාවගේ **දෑත** තරයේ ගෙන සවනතට ආදර ගීයක් **මුමුණමින්** ප්‍රීති වූයේ ය. (**පෙම්වතා** - තද්ධිත, **දෑත** - සන්ධි, **මුමුණමින්** - ක්‍රියා)

(v) **සුළඟින් සෙලවුණු** තුරුපත් පෙළ සෙමින් එළිමහන් **රංගභූමියෙහි** පතිත විය. (**සුළඟින්** - විභක්ති, **සෙලවුණු**- කෘදන්ත, **රංගභූමියෙහි** - විභක්ති)

(ලකුණු 03 × 5 =15 යි.)

| වචනය | ව්‍යාකරණ අංගය | අනු අංගය |
|---|---|---|
| i සඳහිරු | සමාස | ද අරුත් සමස් / ද කාරාර්ථ / ද්වන්ද / චාර්ථ සමාසය |
| තුරු | නිපාත | සීමා අර්ථය |
| වෙත්වා | ක්‍රියා | ආසි කිරිය / ආශීර්වාද / ප්‍රාර්ථනා ක්‍රියා |
| ii පුරාංගනාවෝ | සන්ධි | සමාන ස්වර දීර්ඝ / සවර්ණ ස්වර දීර්ඝ / ස්වර දීර්ඝ |
| වරලස | තද්ධිත | ස්වාර්ථය / එය ම යන අර්ථය |
| සුවඳ | උපසර්ග | වඩා යන අර්ථය / අධික යන අර්ථය / අර්ථෝද්දීපනය කිරීම් අර්ථය / භූෂණාර්ථය |
| iii ගයද්දී | ක්‍රියා | අසම්භාව්‍ය ක්‍රියා / අසබහව් කිරිය /කාලාර්ථ අසම්භාව්‍ය ක්‍රියාව / කල් අරුත් අසබහව් කිරිය |
| ම | නිපාත | අවධාරණ අර්ථය |
| අසුන්වලින් | විභක්ති | අවධි විභක්තිය / අවදි විබත් / පඤ්චමී විභක්තිය |
| iv පෙම්වතා | තද්ධිත | අස්ත්‍යර්ථය / ඇත යන අර්ථය |
| දෑත | සන්ධි | ස්වරාදේශ සන්ධි / සරදෙස් සඳ |
| මුමුණමින් | ක්‍රියා | මිශ්‍ර ක්‍රියා / මුසු කිරිය |
| v සුළඟින් | විභක්ති | කරණ විභක්තිය / කරණ විබත් |
| සෙලවුණු | කෘදන්ත | අතීත කෘදන්ත /කර්මකාරක අතීත කෘදන්ත |
| රංගභූමියෙහි | විභක්ති | අදර විබත් / ආධාර විභක්තිය / සප්තමී විභක්තිය |

**(ලකුණු** (01 **x 3**) **x 5** = 15 යි.)

**6.** (අ) පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය පහත වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

(i) මෙවර රාජ්‍ය සාහිත්‍ය ...................... උත්කර්ෂවත් අයුරින් පැවැත්වීමට විධිවිධාන යොදා ඇත.

(ii) වසන්ත කාලයෙහි ඇසෙන කෝකිල ...................... සැමගේ කන් පිනවයි.

(iii) ගල්ලෙන්වල ඇති ...................... බිතුසිතුවම් සංරක්ෂණය කළ යුතු ය.

(iv) අපේ ගමෙහි සාම්ප්‍රදායික ජන ක්‍රීඩාවන්ගෙන් යුතු අලුත් අවුරුදු ...................... පැවැත්විණි.

(v) මනාල යුවළ පෝරුවට නගින විට බාලිකාවෝ ජය මඟුල් ...................... ගැයූහ.

(vi) සමහර ...................... ගෘහනිර්මාණ ශිල්පීය ලක්ෂණ වර්තමානයේ ද ඇගයීමට ලක් වේ.

(පුරාණ, උලෙළ, ගීත, උත්සවය, පැරණි, ගී) (ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

i. උත්සවය
ii. ගීත
iii. පැරණි
iv. උලෙළ
v. ගී
vi. පුරාණ

(ආ) පහත දක්වා ඇති පද සන්ධි කර ලියන්න.

(i) හත් + අඩිය
(ii) දෙ + අඟුල්
(iii) කථා + උපකථන
(iv) ශාලා + අධිපති
(v) පස් + සාළිස්
(vi) පුන + උත්ථාපන

(ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

i. හත්තඩිය
ii. දෑඟුල්
iii. කථෝපකථන
iv. ශාලාධිපති
v. පන්සාළිස්
vi. පුනරුත්ථාපන

(ඉ) **තද කළු අකුරෙන්** මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

(i) ගවේෂකයා **රටින් රටට** යමින් තොරතුරු එක් රැස් කළේ ය.

(ii) **සිංහලයනි**, නැඟිටිවු. **බුද්ධගයාව** බේරා ගනිවු!

(iii) **තම** භාණ්ඩාගාරය තර කිරීම **ධනවතාගේ** ඒකායන පරමාර්ථය විය. (ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

i. රටින් :- අවධි විභක්තිය / අවදි විබත් / පඤ්චමී විභක්තිය
රටට :- සම්ප්‍රදාන විභක්තිය / සපදන් විබත් / චතුර්ථී විභක්තිය

ii. සිංහලයනි :- ආලපන විභක්තිය / අලප් විබත්
බුද්ධගයාව :- කර්ම විභක්තිය / කම් විබත්

iii. තම :- සම්බන්ධ විභක්තිය / සබඳ විබත් / ෂෂ්ටි විභක්තිය
ධනවතාගේ :- සම්බන්ධ විභක්තිය / සබඳ විබත් / ෂෂ්ටි විභක්තිය

**(ලකුණු ½ x 6 = 03 යි.)**

(ඊ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන වාක්‍ය නැවත ලියන්න.
(i) මහත්මයාණනි මහත්මියනි, පෙව 9.00ට රැස්වීම ඇරඹෙන බව දැනුම් දෙමි.
(ii) 'අනේ මගේ පුත්‍රයා කොහි ද' යනුවෙන් ඈ විලාප නැගුවා ය.
(iii) ඉඳ ඉඳ එක වෙහෙර
විඳ විඳ දහම් මනහර
සිඳ බිඳ දුක් සසර
අහෝ දෙව්දත් නුදුටි මොක්පුර
යන කවිය ඔහු සිහින් ස්වරයෙන් මිමිණුවේ ය. (ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

i. මහත්මයාණනි/ මහත්මියනි, පෙ.ව. 9.00ට රැස්වීම ඇරඹෙන බව දැනුම් දෙමි.

ii. 'අනේ! මගේ පුත්‍රයා කොහි ද?' යනුවෙන් ඈ විලාප නැගුවා ය.

iii. "ඉඳ ඉඳ එක වෙහෙර
විඳ විඳ දහම් මනහර
සිඳ බිඳ දුක් සසර
අහෝ! දෙව්දත් නුදුටි මොක්පුර"
යන කවිය ඔහු සිහින් ස්වරයෙන් මිමිණුවේ ය.

**(ලකුණු ½ x 6 = 03 යි.)**

(උ) පහත දැක්වෙන ප්‍රකාශවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.
(i) "මම මගේ කාර්යය නීත්‍යානුකූල ව ඉටු කරමි"යි ලේකම් නිවේදනය කළේ ය.
(ii) ජාතික ආරක්ෂාව තහවුරු කිරීමට "නුඹ නුඹගේ වගකීම ඉටු කරනු"යි විනිශ්චයකාරයා අණ කළේ ය.
(iii) "අපි ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අද පටන් බලාත්මක කරනවා"යි මන්ත්‍රීවරු එක හඬින් කියා සිටියහ.
(ලකුණු $01 \times 3 = 03$ යි.)

i. තමා තමාගේ කාර්යය නීත්‍යනුකූල ව ඉටු කරන බව / වග ලේකම් නිවේදනය කළේ ය.

ii. ජාතික ආරක්ෂාව තහවුරු කිරීමට ඔහු ඔහුගේ /ඇය ඇයගේ වගකීම ඉටු කරන ලෙස / මෙන් විනිශ්චයකාරයා අණ කළේ ය.

iii. තමන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත එදින / එම දින පටන් බලාත්මක කරන බව / වග මන්ත්‍රීවරු එක හඬින් කියා සිටියහ.

**(ලකුණු** 01 **x 3** = 03 යි.)

**7.** පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**කාශ්‍යපයෝ** සූර්යයා **අස්තංගත** වන සන්ධ්‍යා යාමයේ සීගිරි පර්වතයේ අවරදිග පාර්ශ්වයෙහි ගල්තලාවක් මත අසුන් ගෙන සිටියහ. තම සහෝදරයා ජම්බු ද්වීපයෙන් මහා සේනාවක් ගෙන තමාට හිමි රාජ්‍යත්වය ලබා ගැනීම පිණිස මේ භූමිය **ආක්‍රමණය** කිරීමට පැමිණෙමින් සිටින බව චරපුරුෂයන් ඔහුට දැනුම් දී තිබිණ. සැබවින් ම මේ ස්වභාවාලංකාරයෙන් රමණීය පර්වත බලකොටුව යුද්ධමය වශයෙන් වැදගත් යැයි ඔහු කිසි විටෙක නො සිතුවේ ය. මෙය සතර අතින් වට කළොත් සියලු සැපයුම් මාර්ග අවහිර වනු ඇත. එවිට සුරතින් කඩුව ගෙන ගෙල සිඳ ගැනීම හැර වෙනත් විකල්පයක් නොමැත. තම ජීවිතය විනාශ වූයේ නමුදු මේ **ආහ්ලාදජනක** රම්‍ය කලා නිකේතනය, **මනෝරඤ්ජනීය** වූ සිත්තම් පෙළ වැනසෙනු දැකීමට ඔහු ඉඩ නො දෙන්නේ ම ය. එසේ ම තම අන්තඃපුරයේ සිටින **සුරවමියන්** බඳු **පුරවමියන්** මිය යනු දැකීම ද කෙසේ වත් ඉවසිය නො හැකි ය. එබැවින් කාශ්‍යප පර්වතයෙන් බැස යුද පෙරමුණ වෙත ගමන් කරනුයේ අතරමඟ දී සිය දිවි හානි කර ගත්තේ ය.

(i) ඡේදයේ **තද කළු** අකුරින් මුද්‍රිත වචන අකාරාදි පිළිවෙළට සකස් කර ලියන්න.

(ii) සීගිරි, සිතුවේ ය, දැකීම යන වචනවල යෙදී ඇති පිලි වෙන වෙන ම ලියන්න.

(iii) ඉහත ඡේදයෙන් උපුටා දක්වන්න.

1. රකාරාංශයක් හා මූර්ධජ අක්ෂරයක් සහිත වචනයක්
2. නාසික්‍යාක්ෂර තුනක් අන්තර්ගත වචනයක්
3. ඝෝෂ තාලුජ ව්‍යඤ්ජනාක්ෂරයක් හා යංශය සහිත වචනයක්

(iv) පහත සඳහන් පද විසන්ධි කර සන්ධි විධිය දක්වන්න.
ස්වභාවාලංකාර, සුරතින්, සිත්තම්

(v) පහත දැක්වෙන ක්‍රියා වර්ගවලට උදාහරණ වචනය බැගින් ඡේදයෙන් උපුටා දක්වන්න.
මිශ්‍ර ක්‍රියා, අවසාන ක්‍රියා (අතීත බහු වචනයක්), අසම්භාව්‍යක්‍රියා

(ලකුණු 03 × 5 =15 යි.)

i. අස්තංගත, ආක්‍රමණය, ආහ්ලාදජනක, කාශ්‍යපයෝ, පුරවමියන්, මනෝරඤ්ජනීය, සුරවමියන්
**(අකාරාදි පිළිවෙළ නිවැරදි නම් ලකුණු 03ක් දෙන්න. එකක් හෝ වැරදි නම් ලකුණු හිමි නො වේ.)**

ii. සීගිරි - දීර්ඝ ඉස්පිල්ල, කෙටි ඉස්පිල්ල, කෙටි ඉස්පිල්ල
සිතුවේ ය - කෙටි ඉස්පිල්ල, කෙටි පාපිල්ල, කොම්බුව හා දීර්ඝත්ව ලක්ෂණය / හල් ලකුණ / හල් පිල්ල
දැකීම - කෙටි ඇදය / ඇක්ම / ඇකාරාංශය, දීර්ඝ ඉස්පිල්ල

**(සම්පූර්ණ පිළිතුරට ලකුණු 1යි. කොටසක් නිවැරදි වූ පමණින් ලකුණු හිමි නො වේ.)**

**(ලකුණු** 01 **x 3** = 03 යි.)

iii. 1. ආක්‍රමණය
2. මනෝරඤ්ජනීය
3. රාජ්‍යත්වය

**(ලකුණු** 01 **x 3** = 03 යි.)

iv. ස්වභාව + අලංකාර - සමාන ස්වර දීර්ඝ සන්ධිය / සවර්ණ ස්වර දීර්ඝ සන්ධිය / ස්වර දීර්ඝ සන්ධිය
සුරැ + අතින් - පූර්වස්වර ලෝප සන්ධිය / පෙර සර ලොප් සඳ
සිත් + කම් - පූර්ව රූප සන්ධිය / පෙර රූ සඳ

**(විසන්ධි කිරීමට ලකුණු $^1/_2$ යි. සන්ධි විධි දැක්වීමට ලකුණු $^1/_2$ යි.)**
**(සන්ධිය නම් නො කොට පියවරින් පියවර සකස් කිරීමට ලකුණු හිමි නො වේ.)**

v. පැමිණෙමින්
සිටියහ
කළොත් (01 **x 3 = 03 යි.)**

**(සියල්ල ලකුණු 03x 5 = 15 යි.)**

**8.** පහත සඳහන් මාතෘකාවලින් **තුනක්** තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

(i) පූර්වස්වර ලෝප සන්ධිය
(ii) පූර්වක්‍රියා
(iii) විශේෂණ සමාසය
(iv) අනම්‍යකරණය
(v) කණ්ඨජ අක්ෂර

(ලකුණු 05 × 3 =15 යි.)

**(මෙහි හැඳින්වීමට ලකුණු 02 යි. උදාහරණවලට ලකුණු 03 යි.)**

(i) පූර්වසවර ලෝප සන්ධිය

පූර්වස්වරය ලොප් කොට, පරස්වරය පූර්ව පදයේ අග ඇති ව්‍යඤ්ජනය හා ගැළපීමෙන් සකසා ගන්නා සන්ධිය පූර්වස්වර ලෝප සන්ධිය නම් වේ.

උදා: දින + ඉසුරු = දිනිසුරු
යන + එන = යනෙන
දිගු + ආ = දිගා (දීර්ඝායුෂ)
සුර + ඉඳු = සුරිඳු
ධන + ඇති = ධනැති ආදි උදාහරණ

(ii) පූර්ව ක්‍රියා

කර්තෘගේ අවසාන ක්‍රියාවට පෙර එම කර්තෘ විසින් කරනු ලැබූ සියලු ක්‍රියා පූර්ව ක්‍රියා වශයෙන් හඳුන්වයි.

උදා: පැමිණ, නරඹා, බලා, හඬා, ගයා, නටා, ලියා, කියා, නැමැඳ, පැමිණ, විකොට, බී, බීලා, කාලා

- අම්මා මල් කඩා බුදුන් වැන්දා ය.
- මම ලිපියක් ලියා එය කියවීමි.
- නංගී ගී ගයා නැටුමක් ඉදිරිපත් කළා ය.

iii. විශේෂණ සමාසය

තුල්‍යාධිකරණ විශේෂණයක්, විශේෂ්‍යය සමඟ ගැළපී සිදුවන සමාසය විශේෂණ සමාසය නම් වෙයි.

පූර්ව පදයෙහි හා පර පදයෙහි ලක්ෂණ අනුව විශේෂණ සමාසය පස් වැදෑරුම් ය.

1. විශේෂණ පූර්ව පද සමාසය - නිල්අහස, සුදුගොනා, සිසිල්පැන්
2. විශේෂණ උත්තර/අපර පද සමාසය - සේනකපඬි, රහල්කුමරු, දෙව්දත්තෙර
3. උපමාන පූර්ව පද විශේෂණ සමාසය - ගල්හිත, මල්හිනාව, තිසරතන
4. උපමාන උත්තර/ අපර පද විශේෂණ සමාසය - මුවපියුම, නරසිහ, පාතඹර
5. සංඛ්‍යා පූර්ව පද විශේෂණ සමාසය - නවදොර, පන්සිල්, දසපනත

iv. අනම්‍යකරණය

සිංහල භාෂාවේ නම්‍ය ස්වර තුනකි. ඒවා නම්, ‘අ, උ, ඔ’ යන ස්වර යි. “සුදුසු තන්හි නැමෙන හෙයින් නම්‍ය නාමය යෙදේ.” මේවා අනම්‍ය ස්වර බවට පත් වන්නේ ‘ඇ, ඉ, එ’ යන ලෙසට ය.

ඒ අනුව,

අ > ඇ

උ > ඉ

ඔ > එ

නිදසුන් :

1. ‘අ’වර්ණ > ‘ඇ’වර්ණ වීම

බල්ලා- බැල්ලී බලයි - බැලෙයි

මහලු - මැහැලි හාරයි - හෑරෙයි

2. ‘උ’වර්ණ > ‘ඉ’වර්ණ වීම

උකුණු - ඉකිණි උතුරයි - ඉතිරෙයි

වඳුරු - වැඳිරි සූරයි - සීරෙයි

3. ‘ඔ’වර්ණ > ‘එ’වර්ණ වීම

කොලු - කෙලි ඔරවයි - එරවෙයි

සොර - සෙර සෝදයි - සේදෙයි

v. කණ්ඨජ අක්ෂර

උගුර හා දිව මුල, පිළිවෙළින් ස්ථානය හා කරණය වීමෙන් උපදින අක්ෂර කණ්ඨජ අක්ෂර වශයෙන් හඳුන්වයි. ඒවා නම්,

අ, ආ, ඇ, ඈ, ක, ඛ, ග, ඝ, ඞ, ඟ, හ, අඃ යන අක්ෂර යි.

**(ලකුණු 05 x 3 = 15 යි.)**